# ශ්‍රී ලංකා නාවික හමුදාව

## වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2024

**2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

**වැය ශීර්ෂය 223**

**අන්තර්ගතය** | **පිටු අංකය**


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 | - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 3-8 |
| පරිච්ඡේදය 02 | - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 9-35 |
| පරිච්ඡේදය 03 | - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය | 36-43 |
| පරිච්ඡේදය 04 | - කාර්යසාධන දර්ශක | 44-48 |
| පරිච්ඡේදය 05 | - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය | 49-56 |
| පරිච්ඡේදය 06 | - මානව සම්පත් පැතිකඩ | 57 |
| පරිච්ඡේදය 07 | - අනුකූලතා වාර්තාව | 58-65 |

# 01 පරිච්ඡේදය
## ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1 හැඳින්වීම

ඉන්දියන් සාගරයේ මුහුදු මාර්ගයට මැදිව පිහිටා ඇති ශ්‍රී ලංකාව අතීතයේ සිටම නාවිකයින්ගේ නිබඳ අවධානයට යොමු වූ දිවයිනක් විය. ඒ අනුව පෘතුග්‍රීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් විසින් කාලයෙන් කාලයට අප දිවයින ඔවුන්ගේ පාලනයට නතු කරගන්නා ලදි. සියවසකට අධික කාලයක් ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයින් විසින් නාවික හමුදාවක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා 1937 වර්ෂයේ දී ලංකා නාවික ස්වේච්ඡා බලකාය (Ceylon Naval Volunteer Force) ආරම්භ කරන ලදි. දෙවන ලෝක යුද්ධය අවසානයත් සමඟම රාජකීය නාවික හමුදාව විසින් ලංකා නාවික ස්වේච්ඡා බලකාය බ්‍රිතාන්‍ය නාවික හමුදාව යටතට පවරාගන්නා ලද අතර, එතැන් පටන් එය ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උපසේවය (Ceylon Royal Naval Volunteer Reserve) ලෙස හඳුන්වා දෙන ලදි. 1948 පෙබරවාරි 04 වන දින බ්‍රිතාන්‍ය යටත් විජිතයෙන් නිදහස ලබා ගැනීමත් සමඟින් ශ්‍රී ලංකාවට ස්ථිර නාවික හමුදාවක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව 1950 දෙසැම්බර් 09 වන දින අංක 34 දරන නාවික පනත නීතිගත කළ අතර, එමඟින් ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) පිහිටුවන ලදි. 1972 වර්ෂයේදී හඳුන්වා දුන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟම ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) යන නම ඉවත් කර, ඒ වෙනුවට ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lanka Navy) ලෙස නාමය වෙනස් කරන ලදි. මෙවන් ඉතිහාසයකට හිමිකම් ලබන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් වූ මුහුදේ පවා රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් සිදු කරමින්, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යයන් සඳහා තම උපරිම දායකත්වය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලබා දෙනු ලබයි.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

ශ්‍රී ලංකා නාවික හමුදාව රටේ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ මෙන්ම ගොඩබිමේ දී ක්‍රියාත්මක වේ. මෙහෙයුම් අවශ්‍යතා, වෙනත් හදිසි අවස්ථාවල දී නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් හමුදාවන්ට සහ පොලිසියට සහාය ලබා දී මෑත අතීතයේ දී නාවික හමුදාවට ගොඩබිම්වල මෙහෙයුම් හැකියාව ද විශාල ලෙස වැඩිදියුණු විය.

#### 1.2.1 දැක්ම

ශ්‍රී ලංකාවට අයත් සාගරික සම්පත් ආරක්ෂා කරමින් එහි ජාතික ආරක්ෂාව තහවුරු කරනු වස් නොගැඹුරු සහ ගැඹුරු දියඹෙහි ද අභියෝගයන්ට මුහුණ දිය හැකි ශක්තිමත් නාවික හමුදාවක් ලෙස වර්ධනය වීම.

#### 1.2.2 මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවි, උපකරණ සහිතව නිසි පුහුණුව ලබමින්, සාගරික සම්පත් ආරක්ෂා කරමින් මහ මුහුදේ ආධිපත්‍යය රැකගත හැකි නාවික හමුදාවක් බවට පත් වීම.

#### 1.2.3 අරමුණු

අ. **නාවික කටයුතු**

(1) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව සුරක්ෂිත කිරීම තුළින් ස්වෛරී සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.
(2) අවි ජාවාරම සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම.
(3) නීති විරෝධී සංක්‍රමණිකයින් වැළැක්වීම/ රට තුළට සංක්‍රමණය වීම වැළැක්වීම.
(4) නීති විරෝධී ජාවාරම් වැළැක්වීම.

(5) ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ මුහුදු තීරය භාවිතා කිරීම වැළැක්වීම.

(6) ශ්‍රී ලංකා මුහුදේ අනවසර මසුන් ඇල්ලීම වැළැක්වීම.

(7) මසුන් ඇල්ලීම සහ අනවසර මුලද්‍රව්‍ය මගින් සමුද්‍ර සම්පත් ගවේෂණය කිරීම හා සූරාකෑම වැළැක්වීම සඳහා අධීක්ෂණය.

(8) ත්‍රස්තවාදී ප්‍රහාර, කඩාකප්පල්කාරී ප්‍රහාර, මුහුදු කොල්ලකෑම්වලට එරෙහිව සියලු වරායන් සඳහා ආරක්ෂාව සැපයීම.

(9) යුධමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් සිදු කිරීම සහ ස්වකීය හමුදාවන්ට ආධාර කිරීම සඳහා නාවික සහාය ලබා දීම.

(10) මුහුදු සන්නිවේදන මාර්ග පවත්වා ගෙන යන අතර, අවශ්‍ය විටෙක ආරක්ෂක අංශ සඳහා සැපයුම් සහය සහ මුහුදු ගමන් සැපයීම.

(11) මුහුදේ නිරීක්ෂණ කටයුතු සහ මුදාගැනීමේ මෙහෙයුම් සිදු කිරීම.

(12) කිමිදුම් සහ ගැලවීමේ මෙහෙයුම් සිදු කිරීම.

(13) නැව් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම.

(14) භූමි මෙහෙයුම් සහ භූමි ආරක්ෂාව.

(15) නාවික භටයින් පුහුණු කිරීම.

ආ. <u>නාවික නොවන ක්‍රියාකාරකම්</u>

(1) සිවිල් බලයට ආධාර කිරීම සහ ස්වාභාවික විපත්වලදී ආධාර සැපයීම.

(2) සමුද්‍රීය කුසලතා රජයට සහ වෙනත් සංවිධානවලට ලබා දීම.

(3) නාවික නොවන පුද්ගලයින් පුහුණු කිරීම.

(4) සම්භාවනීය අමුත්තන්ට සහ අනෙකුත් පුද්ගලයින්ට මුහුදු ගමන් පහසුකම් සැපයීම.

(5) රජයේ සහ පෞද්ගලික සංවිධානවලට කිමිදුම් සහ ගැලවීමේ ආධාර ලබා දීම.

(6) ශ්‍රී ලංකා රේගුවට සහාය වීම.

(7) විද්‍යාත්මක හා සාගර දත්ත රැස් කිරීම.

## 1.3 <u>ප්‍රධාන කාර්යයන්</u>

අ. ආරක්ෂක සේනාවන්හී එක් විශේෂ යුධ සේනාංකයක් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාව නම් කළ හැක. මෙහි ප්‍රාථමික කාර්යභාරය වනුයේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රතිපත්තීන්ට අනුව රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා ඊට එරෙහිව හට ගන්නා මොනයම් හෝ තර්ජනයන්ගෙන් රට ආරක්ෂා කිරීමත් ගැඹුරු මුහුදේ, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ දී නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යන් සඳහා දායක වීමත්ය. නාවික හමුදාව මගින් ආරක්ෂා කරන කලාපයන් වශයෙන් මුහුදුකරය, දේශීය ජලතීරය, යාබද කලාප සහ විශේෂිත ආර්ථික කලාපයන් නම් කර ඇති අතර, ඒ ඒ කලාපයන්ට අදාළව පවරා ඇති රාජකාරීන් සාමකාමී හා ගැටුම්කාරී වාතාවරණයන් තුළ එක ලෙස ඉටු කිරීමට නාවික හමුදාව බැඳී සිටියි.

ආ. තවද, විශේෂයෙන් ඇතිවිය හැකි අභ්‍යන්තර ගැටුම් වැනි ගැටලුකාරී අවස්ථාවන්හි දී අනෙකුත් ආරක්ෂක සේවා සමඟ එක්වී ගොඩබිම් මෙහෙයුම් දියත්කර රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කර්තව්‍යන්හී නිරත වීම ද්විතියික කාර්යය ලෙස හැඳින් වේ.

ඇ. තවද, රාජ්‍ය ආයතනයන්හී පරිපාලන කටයුතු සඳහා සහාය වීම, විශේෂයෙන්ම සංවර්ධන වැඩපිළිවෙල උදෙසා සමුද්‍රීය ක්‍රියාකාරකම්වල යෙදී සිටින ආයතන සඳහා සහයෝගය ලබා දීම හා වෙරළ හා සමුද්‍රීය ආරක්ෂණය නාවික හමුදාවේ තෘතීය කාර්යය ලෙස හැඳින්විය හැක.

1.4

## නාවික හමුදා සංවිධාන සටහන



1.5 රටට අයත් මුහුදු තීරය ඵලදායි ලෙස පරිපාලනය සහ ආරක්‍ෂා කිරීමත්, පැවරෙන රාජකාරීන් කාර්යක්‍ෂමව ඉටුකිරීමත් සඳහා සමස්ථ දිවයිනම ආවරණය වන අයුරින් පහත සඳහන් පරිදි නාවික විධාන 07කට බෙදා වෙන් කර පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

| | | | |
|---|---|---|---|
| අ. | බටහිර නාවික විධානය | - | ආඥාපති බටහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |
| ආ. | නැගෙනහිර නාවික විධානය | - | ආඥාපති නැගෙනහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |
| ඇ. | උතුරු නාවික විධානය | - | ආඥාපති උතුරු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |
| ඈ. | උතුරු මැද නාවික විධානය | - | ආඥාපති උතුරු මැද නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |
| ඉ. | දකුණු නාවික විධානය | - | ආඥාපති දකුණු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |
| ඊ. | වයඹ නාවික විධානය | - | ආඥාපති වයඹ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |
| උ. | ගිණිකොණ නාවික විධානය | - | ආඥාපති ගිණිකොණ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි |

1.6 ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇති ඒ ඒ නාවික විධානයන්ට අයත් ගොඩබිම් ආයතන පහත පරිදි වේ.

අ. බටහිර නාවික විධානය

- ශ්‍රීලංනානෞ ලංකා
- ශ්‍රීලංනානෞ ගැමුණු
- ශ්‍රීලංනානෞ මහසෙන්
- ශ්‍රීලංනානෞ රංගල
- ශ්‍රීලංනානෞ පරාක්‍රම
- නාවික මහ රෝහල (කොළඹ)
- ශ්‍රීලංනානෞ ශිල්ප
- ශ්‍රීලංනානෞ කැළණි
- ශ්‍රීලංනානෞ තක්‍ෂිලා
- නාවික ස්ථානගත කිරීම අකුරේගොඩ

ආ. නැගෙනහිර නාවික විධානය

- නාවික හා සාගරික විද්‍යාපීඨය
- ශ්‍රීලංනානෞ විදුර
- 4 වන වේග ප්‍රහාරක යාත්‍රා සමූහය
- ශ්‍රීලංනා තටාකංගණය
- ශ්‍රීලංනානෞ විජයබා
- ශ්‍රීලංනානෞ කාශ්‍යප
- ශ්‍රීලංනානෞ රන්වැලි
- ශ්‍රීලංනානෞ තිස්ස
- ශ්‍රීලංනානෞ මහවැලි
- ශ්‍රීලංනානෞ පැරකුම්බා
- ශ්‍රීලංනානෞ ගෝඨාභය
- විශේෂ යාත්‍රා බලසේණ මූලස්ථානය
- ශ්‍රීලංනානෞ ගෝකණ්න
- ශ්‍රීලංනානෞ වළගම්බා
- ශ්‍රීලංනානෞ ලංකාපටුන

| | | |
|---|---|---|
| ඇ. | උතුරු නාවික විධානය | ශ්‍රීලංනානෞ වේළුසුමන |
| | | ශ්‍රීලංනානෞ කංචදේව |
| | | ශ්‍රීලංනානෞ උත්තර |
| | | ශ්‍රීලංනානෞ එළාර |
| | | ශ්‍රීලංනානෞ අග්බෝ |
| | | ශ්‍රීලංනානෞ වසභ |
| | | ශ්‍රීලංනානෞ ගෝඨයිම්බර |
| | | නාවික ස්ථානගත කිරීම වෙත්තලකේණි |
| ඈ. | උතුරු මැද නාවික විධානය | ශ්‍රීලංනානෞ ශික්‍ෂා |
| | | ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය |
| | | ශ්‍රීලංනානෞ තම්මැන්නා |
| | | ශ්‍රීලංනානෞ ගජබා |
| | | ශ්‍රීලංනානෞ වුස්සදේව |
| | | ශ්‍රීලංනානෞ බුවනෙක |
| ඉ. | දකුණු නාවික විධානය | ශ්‍රීලංනානෞ දක්ෂිණ |
| | | ශ්‍රීලංනානෞ නිපුණ |
| | | ශ්‍රීලංනානෞ කාවන්තිස්ස |
| | | ශ්‍රීලංනානෞ රුහුණ |
| ඊ. | වයඹ නාවික විධානය | ශ්‍රීලංනානෞ විජය |
| | | ශ්‍රීලංනානෞ තම්බපණ්ණි |
| | | ශ්‍රීලංනානෞ හරණ |
| | | ක්‍ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලසේණ මූලස්ථානය |
| | | ශ්‍රීලංනානෞ ථේරපුත්ත |
| | | නාවික ස්ථානගත කිරීම මහව |
| උ. | ගිණිකොන නාවික විධානය | ශ්‍රීලංනානෞ මහානාග |
| | | ශ්‍රීලංනානෞ දිසායු |

ඌ. ශ්‍රී ලංකා නාවික හමුදාව තුළ ඇති නෞකා සහ යාත්‍රාවන්

| | | | |
|---|---|---|---|
| (1) | ගැඹුරු මුහුදු නිරීක්‍ෂණ නෞකා | - | 08 |
| (2) | වේග මිසයිල ප්‍රහාරක නෞකා | - | 02 |
| (3) | වේග ප්‍රහාරක නෞකා | - | 09 |
| (4) | වෙරළාරක්‍ෂක මුර නෞකා | - | 02 |
| (5) | වේග ප්‍රහාරක මුර යාත්‍රා | - | 47 |
| (6) | වේග මගී ප්‍රවාහන යාත්‍රා | - | 02 |
| (7) | ගොඩ බිමට යාහැකි භාණ්ඩ ප්‍රවාහන නෞකා | - | 01 |
| (8) | ගොඩ බිමට යාහැකි මධ්‍යම ප්‍රමාණයේ යාත්‍රා | - | 02 |
| (9) | ගොඩ බිමට යාමට උපයෝගි කර ගන්නා යාත්‍රා | - | 05 |
| (10) | සහායක යත්‍රා | - | 02 |
| (11) | වෙරළ ආරක්‍ෂක මුර යාත්‍රා | - | 04 |
| (12) | වෙරළ ආරක්‍ෂක මුර යාත්‍රා (වෙරළ ආරක්‍ෂක) | - | 67 |
| (13) | වෙරළාසන්න මුර යාත්‍රා | - | 34 |
| (14) | කළපු ආශ්‍රිත යාත්‍රා | - | 21 |
| (15) | ටග් යාත්‍රා | - | 04 |
| (16) | ඇරෝ යාත්‍රා | - | 155 |
| (17) | ට්‍රොලර් සහ වල්ලම් | - | 30 |
| (18) | ඩිංගි යාත්‍රා | - | 288 |

1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

අ. ඉන්දියානු රජය මගින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තටාකංගණයක් ප්‍රදානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට Goa Shipyard ආයතනය එය නිපදවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2024 වර්ෂයේදී එම ව්‍යාපෘතියෙහි 63% ප්‍රගතියක් අවසන් කර ඇත. එම පාවෙන තටාකංගණය 2025 වසර තුළ දී ශ්‍රී ලංකාව වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

ආ. ඇමෙරිකානු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් අඩි 210ක් දිග (Ex USCG DESICIVE) නෞකාව ඇමරිකානු රජයේ ආධාරයක් වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර, අත්පත් කර ගැනීමේ වියදම වශයෙන් ඇ.ඩො.මි 10ක මුදලක් ඇස්තමේන්තු කර ඇති අතර, ශ්‍රී ලංකා රජයට ඉන් ඇ.ඩො.මි 01ක වියදමක් දැරීමට සිදු වේ. නෞකාව ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් අත්සන් කර ඇමෙරිකානු ඩොලර් මිලියන 01ක මුදලක් 2024 සැප්තැම්බර් මස 12 වන දින ගෙවීම් සිදු කරන ලදි. නෞකාවේ කාර්ය මණ්ඩලය මේ වන විට තෝරාගෙන ඇති අතර, නාවික පුද්ගලයින් 06 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් 2025 මාර්තු මස මැද වන විට නෞකාවට එක් කිරීමට නියමිතව ඇත. තවද, මෙම නෞකාව 2025 නොවැම්බර් මාසය වන විට ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට සැලසුම් කර ඇත.

# 02 පරිච්ඡේදය
## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 2024 වර්ෂයට ආදාළ ප්‍රගතිය

#### 2.1.1 ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

අ. නාවික හමුදා ප්‍රතිපත්තිවලට අනුව ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ක්‍රියා, නීති විරෝධී අවි ජාවාරම්, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී සංක්‍රමණිකයින් රට තුළට ඇතුළුවීම්, රේගු නීති උල්ලංඝනය කිරීම්, නීති විරෝධී මසුන් මැරීම හා සාගරය දූෂණය කිරීම් වැනි ක්‍රියාකාරකම් මැඩලීම සඳහා දේශීය සහ විදේශීය බුද්ධි අංශ සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරන ලදි.

ආ. පවතින අඩු මිනිස් බලය තුළින් විශාල භූමි ප්‍රමාණයක් ආවරණය කිරීම සඳහා විශේෂ යතුරු පැදි [All-Terrain Vehicle (ATV)] සහ යතුරු පැදි කණ්ඩායම් පුහුණු කොට වෙරළ තීරයේ සිදු වන අනවසර ක්‍රියාකාරකම් පාලනය කිරීමට කටයුතු කරන ලදි.

#### 2.1.2 නාවික හමුදා පුද්ගලයින්හට වැටුප් හා දීමනා ගෙවීම




| | |
|---|---|
| මූලික වැටුප - නිත්‍ය | රු. 14,653,048,032.50 |
| මූලික වැටුප - ස්වේච්ඡා | රු. 4,547,438,272.50 |
| අනෙකුත් දීමනා - නිත්‍ය | රු. 19,597,685,331.48 |
| අනෙකුත් දීමනා - ස්වේච්ඡා | රු. 6,568,665,171.87 |
| එකතුව | රු. 45,366,836,808.35 |

### 2.1.3 නාවික හමුදා පුද්ගලයින්හට උසස්වීම් ලබා දීම

අ. **නිලධාරීන්**

| අනු අංකය | උසස් කරන ලද නිලය | උසස් කරන ලද ගණන |
|---|---|---|
| 1 | අද්මිරාල් | 01 |
| 2 | වයිස් අද්මිරාල් | 01 |
| 3 | රියර් අද්මිරාල් | 17 |
| 4 | කොමදෝරු | 23 |
| 5 | කපිතාන් | 48 |
| 6 | කොමාණ්ඩර් | 103 |
| 7 | ලුතිනන් කොමාණ්ඩර් | 163 |
| 8 | ලුතිනන් | 104 |
| 9 | උප ලුතිනන් | 125 |
| 10 | වැඩ බලන උප ලුතිනන් | 118 |
| 11 | මධ්‍ය නිලධාරි | 76 |
| **එකතුව** | | **779** |

ආ. **නාවිකයින්**

| අනු අංකය | උසස් කරන ලද තරාතිරම | උසස් කරන ලද ගණන |
|---|---|---|
| 1 | පාලක ප්‍රධාන සුළු නිලධාරි | 374 |
| 2 | සමූහ ප්‍රධාන සුළු නිලධාරි | 1051 |
| 3 | ප්‍රධාන සුළු නිලධාරි | 1439 |
| 4 | සුළු නිලධාරි | 1793 |
| 5 | නායක නැවි | 909 |
| 6 | බල නැවි | 935 |
| 7 | සාමාන්‍ය නැවි | 788 |
| **එකතුව** | | **7289** |

### 2.1.4 නාවික හමුදා පුද්ගලයින්හට පදක්කම් පිරිනැමීම

| අනු අංකය | පදක්කම | නාවික පුද්ගලයින් ගණන |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම | 773 |
| 2 | ප්‍රසංසනීය සේවා විභූෂණය සහ ප්‍රසංසනීය සේවා පදක්කම | 58 |
| 3 | එක්සත් ජාතීන්ගේ සාම සාධක පදක්කම | 3 |
| 4 | නාවික හමුදාධිපතිගේ ප්‍රශංසාත්මක පළඳනාව | 388 |
| 5 | ජාතික ආරක්‍ෂක විද්‍යාලීය පාඨමාලාව සඳහා වූ පළඳනාව | 8 |
| 6 | මුහුදු සංග්‍රාමික පළඳනාව | 791 |
| 7 | මුහුදු විධාන පළඳනාව | 10 |
| 8 | 4 වන වේග ප්‍රහාරක මුර යාත්‍රා පළඳනාව | 775 |
| 9 | ලෝක සමුද්‍ර විශ්ව විද්‍යාලය පළඳනාව | 1 |
| 10 | මාණ්ඩලික නිලධාරී පාඨමාලාව සඳහා වූ පළඳනාව | 29 |
| 11 | නාවික ගුවන් නිරීක්‍ෂණ පළඳනාව | 7 |
| 12 | පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා වූ පළඳනාව | 16 |

### 2.1.5 නාවික හමුදා පුද්ගලයින් හට පුහුණු හා පාඨමාලා ලබා දීම

| පාඨමාලා වර්ගය | පුහුණුව ලැබූ ප්‍රමාණය | |
|---|---|---|
| | නිලධාරීන් | නාවිකයින් |
| අභ්‍යන්තර | 530 | 8814 |
| බාහිර | 676 | 1445 |
| විදේශීය | 189 | 52 |
| විභාග | 196 | 4431 |

2.1.6 **නාවික හමුදා පුද්ගලයින්ගේ සුභසාධනයට අදාළ කටයුතු ඉටු කිරීම**

අ. ඉදුරාම ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිතව විශ්‍රාම ගන්වන ලද නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වාර්ෂිකව සිදු කරනු ලබන සුවදුක් විමසීමේ වැඩසටහන 2024 වර්ෂය සඳහා දෙසැම්බර් මාසය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, එහි දී ප්‍රේෂණපත් මඟින් රු.15,144,000.00ක වටිනාකමින් යුතු මුදලක් සහ නාවික දින දර්ශන නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා ලබා දීමට කටයුතු කරන ලදි.

ආ. ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටිය දී මියගිය/ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිත විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙත ඔවුන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා සහ සුභසාධන කටයුතු වෙනුවෙන් ප්‍රතිලාභීන් 42ක් සඳහා රු. 7,973,133.21ක මූල්‍යාධාර ලබා දීමට කටයුතු කර ඇත.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටියදී මිය ගිය නාවික පුද්ගලයින්ගේ අවමංගල්‍යක දී අවමංගල්‍යාධාර මුදලක් වශයෙන් ළඟම ඥාතීන් හට රු.100,000.00ක මුදලක් ලබා දෙනු ලබන අතර, 2024 වර්ෂය සඳහා මියගිය විශ්‍රාමික නාවික පුද්ගලයින් 47 දෙනෙකුගේ ළඟම ඥාතීන් හට රු. 4,700,000.00ක මුදලක් අවමංගල්‍යාධාර ලෙස ලබා දී ඇත.

ඈ. නැවිරු සවිය (නාවික සුවසහන) අරමුදල මඟින් 2024 වර්ෂය තුළ නාවික හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා බරපතල රෝගාබාධ හා සැත්කම් වෙනුවෙන් රු.313,107,688.77ක මුදලක් ලබා දී ඇත.

ඉ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ක්‍රියාන්විතයේ දී දිවි පිදූ, ආබාධිත වූ හා අතුරුදන් වූ නාවික පුද්ගලයින් වෙනුවෙන් 'මෙත් සෙවණ' නිවාස ව්‍යාපෘතිය මඟින් නිවාස 06ක් ලබා දී ඇති අතර, එම නිවාසවල ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. එමෙන්ම, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සේවයේ නියුතු හා විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙනුවෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතිය යටතේ අර්ධ නිවාස 87ක් ලබා දී ඇති අතර, එම නිවාස 87 අතරින් නිවාස 19ක වැඩ කටයුතු අවසන් කර ඇත.

ඊ. 2024 වර්ෂය තුළ නාවික සමාජීය මෙහෙවර අරමුදල (ස්වේච්ඡා දායක සමුච්චිත අරමුදල්) මඟින් ශල්‍යකර්ම සහ වෛද්‍යාධාර ලබා දීම සඳහා රු.35,895,271.63ක මුදලක් ලබා දී ඇත.

2.1.7 **මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම**

අත්අඩංගුවට ගන්නා ලද සහ සොයා ගන්නා ලද නීති විරෝධී සංක්‍රමණිකයින්, නීති විරෝධී ධීවර කටයුතු සහ නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අ. අවි ආයුධ අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

| | | | |
|---|---|---|---|
| (1) | දේශීය නිෂ්පාදිත ගිනි අවි | - ගණනින් | 9.00 |
| (2) | අත් බෝම්බ | - ගණනින් | 2.00 |
| (3) | මිමී 60 මෝටාර් බෝම්බ | - ගණනින් | 1.00 |
| (4) | දුම් බෝම්බ | - ගණනින් | 2.00 |
| (5) | පුද්ගල නාශක බෝම්බ | - ගණනින් | 4.00 |
| (6) | 7.62 x 45 මිමී ජීව උණ්ඩ | - ගණනින් | 2.00 |
| (7) | පැති අවි ජීවී උණ්ඩ | - ගණනින් | 4.00 |
| (8) | ක්ලේමෝර් බෝම්බ | - ගණනින් | 2.00 |
| (9) | 7.62 x 54 මිමී ජීව උණ්ඩ | - ගණනින් | 15.00 |
| (10) | 7.62 x 39 මිමී ජීව උණ්ඩ | - ගණනින් | 4,523.00 |
| (11) | වෝටර් ජෙල් කරල් | - ගණනින් | 665.00 |
| (12) | TNT | - ග්‍රෑම් | 170.00 |
| (13) | දේශීය නිෂ්පාදිත චාජර්ස් | - ගණනින් | 122.00 |
| (14) | විදුලිමය නොවන ඩෙටනේටර් | - ගණනින් | 30.00 |
| (15) | සේවා නූල | - අගල් | 16.00 |
| (16) | LTTE නිල ඇඳුම් | - ගණනින් | 3.00 |
| (17) | අත්අඩංගුවට ගත් පුද්ගලයින් | - ගණනින් | 16.00 |

ආ. නීති විරෝධී ධීවර කටයුතු වැළැක්වීම්

| | | | |
|---|---|---|---|
| (1) | අත්අඩංගුවට ගත් ට්‍රෝලර් යාත්‍රා මෙරට | - ගණනින් | 9.00 |
| (2) | අත්අඩංගුවට ගත් ට්‍රෝලර් යාත්‍රා (ඉන්දියන්) | - ගණනින් | 73.00 |
| (3) | අත්අඩංගුවට ගත් ඩිංගි යාත්‍රා | - ගණනින් | 278.00 |
| (4) | අත්අඩංගුවට ගත් වල්ලම් | - ගණනින් | 2.00 |
| (5) | නීති විරෝධී දැල් ආම්පන්න | - ගණනින් | 2,594.00 |
| (6) | අත්අඩංගුවට ගත් වෝටර් ජෙල් | - කි.ග්‍රෑ. | 99.70 |
| (7) | අත්අඩංගුවට ගත් පුද්ගලයින් මෙරට | - ගණනින් | 927.00 |
| (8) | අත්අඩංගුවට ගත් පුද්ගලයින් (ඉන්දියන්) | - ගණනින් | 554.00 |

ඇ. නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

| | | | |
|---|---|---|---|
| (1) | බීඩි කොළ | - කි.ග්‍රෑ. | 52,355.12 |
| (2) | දුම්වැටි | - ගණනින් | 26,890 |
| (3) | මත්පැන් | - බෝතල් | 226.00 |
| (4) | බියර් | - කෑන් | 137.00 |
| (5) | කෘමි නාශක | - බෝතල් | 4,330.00 |
| | | - පැකට් | 27,169.00 |
| (6) | රත්‍රං | - කි.ග්‍රෑ. | 4.74 |
| (7) | ගජමුතු | - ගණනින් | 11 |
| (8) | කැස්බෑ මස් | - කි.ග්‍රෑ. | 35.90 |
| (9) | හරක් මස් | - කි.ග්‍රෑ. | 71.00 |
| (10) | අම්බර් | - කි.ග්‍රෑ. | 64.22 |
| (11) | කහ | - කි.ග්‍රෑ. | 6,237.20 |
| (12) | වාලම්පුරි | - ගණනින් | 11 |
| (13) | හක් බෙල්ලෝ | - ගණනින් | 19,846 |
| (14) | ගවයින් | - ගණනින් | 8 |
| (15) | කජු | - කි.ග්‍රෑ. | 50.00 |
| (16) | ඉඟුරු | -කි.ග්‍රෑ. | 368.85 |
| (17) | වල් ඌරු මස් | - කි.ග්‍රෑ. | 7.00 |
| (18) | පැරණි කාසි | -ගණනින් | 263 |
| (19) | ව්‍යාජ මැණික් | - ගණනින් | 11 |
| (20) | අත්අඩංගුවට ගත් පුද්ගලයින් | - ගණනින් | 127 |

2.1.8 **<u>අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාව හා සාම සාධක රාජකාරී</u>**

අ. 2024 ජනවාරි මස 01 වන දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා නිලධාරීන් දෙදෙනෙකු එක්සත් ජාතික සාමසාධක රාජකාරී සඳහා විදෙස්ගත කිරීමට කටයුතු කර ඇත.

ආ. ඉන්දියාව, පාකිස්ථානය සහ බංගලාදේශය වැනි රටවල්වල සහභාගීත්වය ඇතිව "Blue whale" අභ්‍යාසය සාර්ථකව පැවැත්වීම මඟින් කලාපීය රටවල නාවික හමුදා සමඟ සහයෝගීත්වය වර්ධනය සහ දැනුම බෙදාගැනීමට කටයුතු කිරීම.

2.1.9 **මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග**

අ. නාවික හමුදා බුද්ධි අංශ සාමාජිකයින් විසින් සපයනු ලැබූ තොරතුරුවලට අනුව 2024 වර්ෂය තුළ අත්අඩංගුවට ගන්නා ලද/ සොයා ගන්නා ලද නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ ඒ සම්බන්ධව අත්අඩංගුවට ගත් පුද්ගලයින් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| (1) | හෙරොයින් | - කි.ග්‍රෑ. | 622.83 |
| (2) | ක්‍රිස්ටල් මෙතපිටමයින් (අයිස්) | - කි.ග්‍රෑ. | 1,211.51 |
| (3) | කේරළ ගංජා | - කි.ග්‍රෑ. | 1,483.34 |
| (4) | දේශීය ගංජා | - කි.ග්‍රෑ. | 119.86 |
| | | - පැල | 107,626 |
| (5) | මෝදක | - ගණනින් | 952 |
| (6) | මත්පෙති | - ගණනින් | 1,178,237 |
| (7) | කසිප්පු | - ලීටර් | 100.00 |
| (8) | ගෝඩා | - ලීටර් | 440.00 |
| (9) | අත්අඩංගුවට ගත් පුද්ගලයින් | - ගණනින් | 215 |

ආ. 2024 වර්ෂය තුළ මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 924ක ප්‍රමාණයක් සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි පැවැත්වීමට කටයුතු කිරීම සහ මත්ද්‍රව්‍ය හා විවිධ ඇබ්බැහිවීම්වලට ගොදුරු වූ නාවික පුද්ගලයින් 49ක ප්‍රමාණයක් පුනුරුත්තාපනය කර සමාජ ගත කිරීමට කටයුතු කිරීම.

2.1.10 **ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව, සුභසාධනය, ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය සහ ආපදා කළමනාකරණයට සහය දැක්වීම**.

අ. දැනට ශ්‍රී ලංකාව තුළ තැලිසීමියා රෝගීන් 3,500 – 4,000 අතර, ප්‍රමාණයක් වාර්තා වන අතර, මෙය නව දරු උපත් සමඟ වාර්ෂිකව වැඩි වීමකට ලක් වේ. මෙම රෝගීන් සඳහා අත්‍යාවශ්‍ය Desferrioxamine infusion system එක් පද්ධතියක් පිටරටින් ආනයනය කිරීම සඳහා රු. 100,000.00ක පමණ මුදලක් වැය වන අතර 2011 වර්ෂයේ සිට නාවික හමුදාව මගින් එකක් රු.10,000.00ක පමණ මුදලකට වර්ෂයක දී පද්ධති 400ක ප්‍රමාණයක් නිපදවීමට කටයුතු කර ඇත. මේ සඳහා සියලු නාවික පුද්ගලයන්ගේ දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන නාවික සමාජ මෙහෙවර අරමුදලෙන් සිදු කරනු ලබයි. තවද, 2023 සහ 2024 වර්ෂයන්වල දී සෞඛ්‍ය අමාත්‍යාංශයේද සහයෝගය ලබා දී ඇති අතර, රෝගීන්ගේ සුභසාධනය සඳහා නාවික හමුදාව මගින් මෙම කටයුත්ත ඉදිරියටත් සිදු කිරීමට බලාපොරොත්තු වේ. දැනට පද්ධති 3,164ක් නිපදවා සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දී ඇත.

ආ. සොරොව් අලුත්වැඩියා කිරීම්, ආගමික උත්සව, ජල ක්‍රීඩා තරඟ, ගංවතුර තත්වයන් ඉදිකිරීම් සහ සංවර්ධන යන කටයුතුවලදී අවස්ථාවන් 48ක දී කිමිදුම් කණ්ඩායම්හි දායකත්වය ලබා දීමට කටයුතු කර ඇත.

ඇ. ආගමික උත්සව, ගංවතුර තත්වයන් සහ ජල ක්‍රීඩා තරඟ යන කටයුතු සඳහා අවස්ථා 23ක දී ජීවිතාරක්ෂක රාජකාරි වෙනුවෙන් ජීවිතාරක්ෂක කණ්ඩායම්හි දායකත්වය ලබා දී ඇත.

ඈ. 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා මෘත ශරීර 38ක් සෙවීමේ කටයුතු සඳහා සහභාගී වී ඇති අතර, ඉන් මෘත ශරීර 13ක් සොයා ගෙන ඇත.

ඉ. 2024 ජුලි මස 03 වන දින 1930 පැයට කුරිකට්ටුවාන් ජැටියේ සිට නාගදීප ජැටිය වෙත බඩු ප්‍රවාහනය කරමින් තිබූ සිවිල් යාත්‍රාවක් පෙරළී අනතුරට පත් වූ පිරිස බේරාගැනීමටත්, 2024 සැප්තැම්බර් මස 09 වන දින කුරිකට්ටුවාන් ජැටියේ සිට ඩෙල්ෆ් දූපත දක්වා ගමන් කිරීමට තිබූ සිවිල් යාත්‍රාවකට නැඟීමට ගොස් ජලයට වැටී අනතුරට පත් වූ සිවිල් පුද්ගලයෙකු බේරා ගැනීමට සහ 2024 නොවැම්බර් මස 27 වන දින ගං වතුර ආපදාවට ලක්ව සිටි දුටුවැව ප්‍රදේශයේ ගසක රැඳී සිටි පුද්ගලයෙකු බේරා ගැනීමට කටයුතු කර ඇත.

2.1.11 නාවික හමුදාව මගින් බාහිර ආයතන සඳහා සිදු කරන ලද ව්‍යාපෘතීන්

අ.

| අනු අංකය | විස්තරය | ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු. මිලි) | 2024 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන | 2024 වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන | 2024 වර්ෂය තුළ සිදු කරන ලද මුළු ව්‍යාපෘති ගණන |
|---|---|---|---|---|---|
| 1 | ආගමික ස්ථාන | 1,711.80 | 34 | 66 | 100 |
| 2 | ආගමික නොවන ස්ථාන | 11,042.73 | 56 | 32 | 88 |

ආ. යුද්ධයෙන් ආබාධිත වූ රණවිරුවන් වෙනුවෙන් කෘතිම අත් හා පාද නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියට පරිත්‍යාග වශයෙන් ලද ඉන්දියානු රුපියල් 7,659,958.00 වටිනා කෘතිම අත් හා පාද නිෂ්පාදනයට අවශ්‍ය විෂයයන් රේගුව වෙතින් නිශ්කාශනය කිරීම (විෂයයන් නිෂ්කාශනයේදී දැරීමට සිදුවූ වියදම් රණවිරු සේවා අධිකාරිය විසින් ආවරණය කරන ලදී).

2.1.12 නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය (ප්‍රති ආශ්‍රුතිකරණ යන්ත්‍ර) විසින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර

| ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති | | සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති | | විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|
| වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති | වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති | වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති | වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති | වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති | වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති | වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති | වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති |
| 45 | 46 | 05 | - | 37 | 09 | 87 | 55 |

2.1.13 පුද්ගලයින් සහ සිවිල් ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීම සඳහා සහය දැක්වීම

අ. <u>නිරෝගීමත් නාවික හමුදාවක් (Healthy Navy)</u>. මෙම වැඩසටහන මගින් නාවික පුද්ගලයන් හට බෝ නොවන රෝග (NCDs) ඇති වීම අවම කිරීම සඳහා සෞඛ්‍යමය පුරුදු ඇති කිරීම, ව්‍යායාම කිරීම සඳහා පෙළඹවීම, නිවැරදි පෝෂණය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම සහ සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම.

ආ. <u>සුවදිවි මධ්‍යස්ථානය (Healthy Living Center)</u>. මෙම වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්වලට සමගාමීව සුවදිවි මධ්‍යස්ථානය මගින් දියවැඩියාව, අධි රුධිර පීඩනය සහ තරබාරුකම වැනි බෝ නොවන රෝග සම්බන්ධයෙන් දිනපතා සෞඛ්‍ය අධ්‍යාපන දැනුවත් කිරීම් නාවික රෝහල්වල සිදු කිරීම.

ඇ. සියලුම නාවික කඳවුරු ආවරණය වන පරිදි එම ආයතනයන්හි රාජකාරී නියුතු සියලුම නාවික පුද්ගලයින් සඳහා බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන්, ලිංගාශ්‍රිත රෝග බෝ වීම වැලැක්වීම, පෞද්ගලික සනීපාරක්ෂාව, ආහාර ආරක්ෂාව, මාර්ග අනතුරු වළක්වා ගැනීම සහ බෝ නොවන රෝග පිළිබඳ විශේෂ වැඩසටහන් පැවැත්වීම.

ඈ. **කිමිදුම් වෛද්‍ය ප්‍රතිකාර (Diving Treatment – Decompression Sickness)**. 2024 වර්ෂයෙ දී දේශීය සහ විදේශීය කිමිදුම්කරුවන් 07 දෙනෙකු හට සිදු වූ කිමිදුම් රෝගී තත්වයන්වලදී ඔවුන් හට ප්‍රතිකාර කටයුතු සිදු කිරීම.

ඉ. රජයේ රෝහල්වල සිදු වන වැඩ වර්ජන අවස්ථාවන්හි දී රෝහල් කටයුතු අඛණ්ඩව සිදු කර ගෙනයාම සඳහා නාවික හමුදා වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලබා දීම.

ඊ. දිවයින තුළ උද්ගතවන ස්වභාවික ව්‍යසන අවස්ථාවන්වලදී සිවිල් ප්‍රජාව වෙත වෛද්‍ය පහසුකම් සැපයීම.

උ. සෞඛ්‍ය අමාත්‍යංශය මගින් සංවිධානය කරන විවිධ නිවාරණ වැඩසටහන් සහ පාගමන් සඳහා නාවික හමුදාවේ සහභාගීත්වය ලබා දීම.

ඌ. රජයේ රෝහල් හා සම්බන්ධිකරණය වී සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි ලේ දන් දීමේ වැඩසටහන් පැවැත්වීම (2024 වර්ෂය සඳහා වැඩසටහන් 24ක් සිදු කර ඇත).

එ. නාවික පුද්ගලයින් නාවික, පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින්, නාවික හමුදා සිවිල් සේවකයින්, විශ්‍රාමික නාවික හමුදා පුද්ගලයින්, ආබාධිත නාවික පුද්ගලයින්, ආරක්ෂක අමාත්‍යංශ කාර්ය මණ්ඩලය සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නාවික රෝහල් මගින් ලබා දීම.

ඒ. නාවික හමුදා පුද්ගලයින්ගේ සහ සිවිල් ජනතාවගේ මුඛ සෞඛ්‍ය තත්වය උසස් මට්ටමකට ලඟාකර ගැනීම සඳහා විධාන දන්ත ශල්‍යාගාර හා ජංගම දන්ත ශල්‍යාගාර බස් රථය මගින් සියලුම නාවික විධානයන් දිවයිනේ විවිධ ප්‍රදේශ ආවරණය වන පරිදි ජංගම දන්ත වෛද්‍ය සායන හා මුඛ සෞඛ්‍ය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2.1.14 **නාවික හමුදාව ලද සුවිශේෂී ජයග්‍රහණ**

අ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින් විසින් 2024 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගැනීමට කටයුතු කර ඇත.

| ක්‍රීඩා තරගාවලිය සම්බන්ධ විස්තර | රන් පදක්කම් | රිදී පදක්කම් | ලෝකඩ පදක්කම් |
|---|---|---|---|
| 18 වන ජාතික වූෂු ශූරතාවලිය 2024 | 17 | 04 | 06 |
| NSSF ශ්‍රී ලංකා රයිෆල්/පිස්ටල් විවෘත තරගාවලිය 2024 | 07 | 08 | 03 |
| ජාතික මල්ලවපොර ශූරතාවලිය 2024 | 07 | 04 | 05 |
| 06 වන ලෝක ශූරතා කැරම් තරගාවලිය 2024 - ඇමෙරිකාව (කැලිෆෝනියා) | | 02 | |
| 60 වන ජාතික ජූඩෝ ශූරතාවලිය 2024 | 02 | 01 | 05 |
| ශ්‍රී ලංකා මුෂ්ටි ප්‍රහාරක සම්මේලන තරගාවලිය 2024 | 03 | 03 | 10 |
| ජාතික කරාතේ ශූරතාවලිය 2024 | 04 | 03 | 08 |
| 75 වන Mr.Sri Lanka කායවර්ධන ශූරතාවලිය 2024 | 01 | 04 | |
| ජාත්‍යන්තර ජූඩෝ ශූරතාවලිය 2024 - තායිලන්තය | නායක කාන්තා නැවි කේවීඑස්ඩී කුමාරසිංහ ඩබ්වීඑස් 73587 විසින් ලෝකඩ පදක්කම දිනාගන්නා ලදී. | | |
| GRAND SLAM කැරම් තරගාවලිය 2024 | නායක කාන්තා නැවි ජේ රොෂිතා ඩබ්වීඑස් 74028 විසින් ශූරතාවය දිනාගන්නා ලදී. | | |

ආ. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් සංවිධානය කරන ලද "ටෙක්නො ශ්‍රී ලංකා" නව නිපැයුම් ප්‍රදර්ශනයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් ඉංජිනේරු අංශය වෙනුවෙන් නැගෙනහිර නාවික විධානය, දකුණු නාවික විධානය සහ උතුරු නාවික විධානයන් වෙතින් ඉදිරිපත් කරන ලද නව නිපැයුම් සඳහා සම්මාන ලබා ගැනීම.

ඇ. 2024 වර්ෂය තුළදී විදුලි හා විද්‍යුත් අංශයේ නාවිකයින් 95 දෙනෙකු ජාතික වෘත්තීය පුහුණු සහතික පත්‍ර IV ලබා ගැනීම මෙන්ම නාවිකයින් 130 දෙනෙකු ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සාමාජිකත්වය හිමිකර ගැනීම.

ඈ. අධ්‍යක්ෂ ජෙනරාල් විදුලි හා විද්‍යුත් දෙපාර්තමේන්තුව වෙත ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය මගින් 2024 සැප්තැම්බර් 18 වන දින සිට වසර 03ක කාලසීමාවක් තුළ වරකට ඉංජිනේරුවන් 05 දෙනෙකු බැගින් පුහුණු කිරීමේ අනුමැතිය හිමිකර ගන්නා ලදි.

### 2.1.15 <u>නාවික හමුදාවට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝග</u>

අ. නාවික හමුදා පිරිස් බලයෙහි ඌණතාවය සහ 2024 දෙසැම්බර් මස 31 වන දිනට පිරිස් බලය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

| විස්තරය | අනුමත පිරිස් බලය | පවතින පිරිස් බලය | ඌණතාවය |
|---|---:|---:|---:|
| නිලධාරීන් | 3,768 | 3,133 | 635 |
| නාවිකයින් | 49,232 | 39,341 | 9,891 |
| එකතුව | 53,000 | 42,474 | 10,526 |

ආ. පවතින පිරිස් බල ඌණතාවයට සාපේක්ෂව ආවරණය කළ යුතු භූමි ප්‍රමාණයේ විශාලත්වය මත ඇති වන ගැටලු.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව පවතින විශාල නාවික යාත්‍රා නවතා තැබීම සඳහා ත්‍රිකුණාමල නාවික කඳවුරෙහි ප්‍රමාණවත් ජැටි පහසුකම් නොමැතිවීම නිසා දැනට ඉදිකරමින් පවතින නාවික ජැටිය 2025 වර්ෂය තුළ කඩිනමින් නිම කිරීම.

ඈ. අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින් සඳහා ඉදිරි නීති ක්‍රියාමාර්ග ගැනීමේ දී ඇතිවන පහත සඳහන් ප්‍රායෝගික ගැටලු;

(1) නීති විරෝධී ධීවර කටයුතුවල නිරත පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ දී ධීවර පරීක්ෂකවරුන් සම්බන්ධකර ගැනීමට අපහසු වීම.

(2) දඩ මුදල් වටිනාකම් දිර්ඝ කාලීනව සංශෝධනය නොවීම.

(3) නීති අර්ථකථනයේ දි ඇති වන ගැටලු.

(4) සාක්ෂි සම්පිණ්ඩනයේ දී සහ ආවර්ජනය කිරීමේ දී ඇති වන අපහසුතාවයන්.

(5) මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ නාවික පුද්ගලයින් සේවයෙන් ඉවත්වීම/ විශ්‍රාම යාම.

### 2.1.16 <u>නාවික හමුදාව ලඟා කර ගැනීමට නියමිත ප්‍රධාන ඉදිරි ඉලක්ක</u>

අ. ඉන්දියානු රජය මගින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තටාකංගණයක් ප්‍රදානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට Goa Shipyard ආයතනය එය නිපදවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, 2024 වර්ෂයේ දී එම ව්‍යාපෘතියෙහි 63% ප්‍රගතියක් අවසන් කර ඇත. එම පාවෙන තටාකාංගණය 2025 වසර අවසානයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීම.

ආ. ඇමෙරිකානු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් අඩි 210ක් දිග (Ex USCG DESICIVE) නෞකාව ඇමරිකානු රජයේ ආධාරයක් වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර, නෞකාව 2025 නොවැම්බර් මාසය වන විට ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීම.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ සුභසාධනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගනිමින් නව ඉදිකිරීම් ව්‍යාපෘති 36ක් සඳහා රු.මි. 809.26ක් ද යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 41ක් සඳහා රු.මි. 338.15ක් ද ගොඩනැගිලි හා ව්‍යුහ නවීකරණය සහ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති 112ක් සඳහා රු.මි. 281.76ක් ද භාවිතා කර මුළු ව්‍යාපෘති 189ක් 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීම.

ඈ. නාවික හමුදාව තුළ කඩදාසි භාවිතය අවම කිරීම සඳහා නව පරිගණක වෙබ් අඩවි නිර්මාණය කිරීම.

ඉ. නව තාක්ෂණික ඩිජිටල් සෞඛ්‍ය වාර්තා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම, නව තාක්‍ෂණික වෛද්‍ය උපකරණ මිලදී ගැනීම තුළින් හෘද, විකලාංග, අක්ෂි ඇතුළු විශේෂිත සත්කාර ඒකක පුළුල් කිරීම මෙන්ම නාවික රෝහල (කොළඹ) හි සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම.

ඊ. කිමිදුම් ප්‍රතිකාර කටයුතු පුළුල් කිරීම සඳහා නාවික මහ රෝහල (කොළඹ) සහ නාවික රෝහල (දකුණු විධානය) හි ප්‍රතිපීඩන කුටීරයක් ස්ථාපිත කිරීම සහ ශ්‍රීලංනානෞ උත්තර සහ ශ්‍රීලංනානෞ විදුර ආයතනයන්හි නව දන්ත ශල්‍යාගාරයන් ස්ථාපිත කිරීම.

උ. දුරස්ථ පාලක යොදා ගෙන බෝම්බ පුපුරවා හැරීම සිදු කළ හැකි රොබෝ යන්ත්‍රයක් මේ වන විට පර්යේෂණ තත්වයේ පැවතීම.

ඌ. නිරන්තර සිදු වන සමාජීය අරගල සහ විරෝධතා සඳහා අවශ්‍ය වන කැරලි මර්ධන උපකරණ නාවික හමුදාව තුළ නිපදවා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කිරීම.

එ. වේව්රයිඩර් වර්ගයේ වෙරළාරක්ෂක මුර යාත්‍රා 06ක් සහ මීටර් 20ක් දිගැති වෙරළාරක්ෂක මුර යාත්‍රාවක් තැනීමේ කටයුතු අවසන් කිරීම.

2.1.17 **<u>නාවික හමුදාව තුළ සිදු කරන ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති</u>**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | සිදු කරන ලද නාවික ප්‍රදේශය සහ ස්ථානය | ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය | ව්‍යාපෘතිය අවසන් කරන දිනය | ඇස්තමේන්තු ගත මුදල | **2024** දෙසැම්බර් මස 31 වන දිනට වියදම් කර ඇති මුදල | අවසන් කර ඇති වැඩ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස **(2024** දෙසැම්බර් මස 31 වන දිනට**)** |
|---|---|---|---|---|---|---|---|
| 1 | ත්‍රිකුණාමලය නාවික තටාකංගණයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය | නැගෙනහිර නාවික පෙදෙස | 24.03.2015 | 31.12.2025 | 4,611,360,000.00 | 3,403,598,532.92 | 58.00% |
| 2 | ත්‍රිකුණාමලය නාවික තටාකංගණයහි දසමහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 01.12.2015 | 30.03.2025 | 450,000,000.00 | 292,440,000.00 | 99.73% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | නාවික හා සාගරික විද්‍යාපීඨයේ නිලධාරි පුහුණු කිරීමේ සංචිතය ඉදිකිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 20.02.2019 | 31.12.2025 | 546,330,000.00 | 445,300,000.00 | 79.55% |
| 4 | විශේෂ යාත්‍රා බලසෘණ මූලස්ථානයේ සිව් මහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 24.07.2019 | 30.06.2025 | 230,000,000.00 | 208,930,000.00 | 87.00% |
| 5 | විශේෂ යාත්‍රා බලසෘණ මූලස්ථානයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 31.05.2022 | 31.12.2025 | 104,929,785.49 | 7,970,000.00 | 43.15% |
| 6 | නාවික තටාකාංගණයේ පෞරාණික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 10.12.2016 | 31.12.2025 | 55,430,000.00 | 7,970,000.00 | 93.00% |
| 7 | ශ්‍රීලංනානෞ පැරකුම්බා ආයතනයේ අඩි 75ක සංඥා කුලුනක් ඉදිකිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 01.05.2023 | 30.05.2025 | 14,000,000.00 | 3,600,000.00 | 29.16% |
| 8 | නාවික තටාකංගණයේ මැහුම් මධ්‍යස්ථානය නාවිකයන්ගේ විවාහක නිල නිවාසයක් බවට පරිවර්තනය කිරීම (ෆ්ලික් නිල නිවාස 01,02,03,04) | නැගෙනහිර නාවික පෙදෙස | 09.09.2024 | 31.12.2024 | 13,850,000.00 | 12,574,065.83 | 100.00% |
| 9 | පෙපර් පොට් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම | නැගෙනහිර නාවික පෙදෙස | 18.09.2024 | 31.12.2024 | 11,800,000.00 | 9,814,787.59 | 100.00% |
| 10 | ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වේ පස් මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම | බටහිර නාවික පෙදෙස | 04.08.2021 | 31.12.2024 | 218,000,000.00 | 105,700,000.00 | 48.15% |
| 11 | වැලිසර මහල් දහයකින් යුත් කනිෂ්ඨ නාවිකයින්ගේ විවාහ නිවාස ඉදිකිරීම (පළමු අදියර) | බටහිර නාවික පෙදෙස | 28.08.2019 | 31.12.2025 | 754,000,000.00 | 70,070,000.00 | 20.46% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 12 | සමුද්‍ර ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) ව්‍යාපෘතිය පිහිටුවීම | බටහිර නාවික පෙදෙස | 01.07.2023 | 30.03.2024 | 10,460,000.00 | 5,514,482.40 | 100.00% |
| 13 | දියතලාව කනිෂ්ඨ නිලධාරි නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරය | බටහිර නාවික පෙදෙස | 17.11.2024 | 10.02.2025 | 14,760,000.00 | 4,209,104.30 | 25.60% |
| 14 | වැලිසර නාවික රෝහලහි ප්‍රධාන ප්‍රතිසංස්කරණ (පළමු අදියර) | බටහිර නාවික පෙදෙස | 20.03.2022 | 31.12.2025 | 19,000,000.00 | 15,680,000.00 | 99.50% |
| 15 | ශ්‍රීලංනානෞ මහසෙන් ආයතනයේ මධ්‍යම නිලඇඳුම් ගබඩා ගොඩනැගිල්ල සඳහා ගිනි නිවීමේ පද්ධතියක් සැකසීමේ ව්‍යාපෘතිය | බටහිර නාවික පෙදෙස | 30.06.2023 | 31.12.2024 | 10,200,000.00 | 6,730,000.00 | 82.00% |
| 16 | ශ්‍රීලංනානෞ ලංකා රාජකීය නාවික ස්වේච්ඡා සංචිත සංගමය සඳහා යෝජිත කාර්යාල ගොඩනැගිල්ල | බටහිර නාවික පෙදෙස | 24.10.2024 | 24.04.2025 | 17,600,000.00 | 1,315,831.75 | 4.70% |
| 17 | වැලිසර නාවික හමුදා සංකීර්ණයේ සේවා වනිතා උපයෝගිතා මධ්‍යස්ථානයක් පිහිටුවීම | බටහිර නාවික පෙදෙස | 10.09.2024 | 31.12.2025 | 24,180,000.00 | 12,750,036.50 | 86.00% |
| 18 | ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයේ සයමහල් කනිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම | දකුණු නාවික පෙදෙස | 01.04.2019 | 07.07.2024 | 186,000,000.00 | 154,100,000.00 | 100.00% |
| 19 | හම්බන්තොට නාවික හමුදා කඳවුරේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම හා ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ආයතනයේ පස් මහල් කනිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම | දකුණු නාවික පෙදෙස | 17.06.2 017 | 31.12.2026 | 360,000,000.00 | 204,280,000.00 | 45.50% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 20 | ශ්‍රීලංකානෞ නිපුණ ආයතනයේ පොදු භෝජනාගාරය සහ කනිෂ්ඨ නාවිකයින් සඳහා නවාතැන් සඳහා සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | දකුණු නාවික පෙදෙස | 02.04.2024 | 31.12.2026 | 244,000,000.00 | 147,320,000.00 | 46.10% |
| 21 | ශ්‍රීලංකානෞ දක්ෂිණ ආයතනයේ ඉංජිනේරු වැඩපලෙහි වහලය ප්‍රතිසංස්කරණය කිරීම | දකුණු නාවික පෙදෙස | 05.11.2019 | 25.07.2024 | 12,600,000.00 | 11,190,000.00 | 100.00% |
| 22 | ශ්‍රීලංකානෞ නිපුණ ආයතනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවතින මලාපවහන බැහැර කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම | දකුණු නාවික පෙදෙස | 25.02.2023 | 30.04.2024 | 20,000,000.00 | 4,110,000.00 | 100.00% |
| 23 | සමුද්‍ර ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) ව්‍යාපෘතිය | දකුණු නාවික පෙදෙස | 28.02.2023 | 30.04.2024 | 12,930,000.00 | 2,423,747.00 | 100.00% |
| 24 | ශ්‍රීලංකානෞ දක්ෂිණ ආයතනයේ අංක 02 ලිස්සීමේ මාර්ගය ඉදිකිරීම (නෞකාවන් අලුත්වැඩියාව සඳහා දිය යට දුම්රිය මාර්ගය පිළිසකර කිරීම) | දකුණු නාවික පෙදෙස | 25.03.2023 | 31.12.2025 | 49,000,000.00 | 12,800,000.00 | 19.50% |
| 25 | ශ්‍රීලංකානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම | උතුරු නාවික පෙදෙස | 15.05.2015 | 31.12.2025 | 450,000,000.00 | 271,580,000.00 | 73.27% |
| 26 | ශ්‍රීලංකානෞ එළාර අංක 03 ජැටිය වැඩිදියුණු කිරීම | උතුරු නාවික පෙදෙස | 15.07.2023 | 31.12.2026 | 68,350,000.00 | 16,750,000.00 | 16.30% |
| 27 | ශ්‍රීලංකානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය | උතුරු මැද නාවික පෙදෙස | 03.02.2017 | 31.12.2027 | 369,190,000.00 | 225,380,000.00 | 63.75% |
| 28 | උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම | උතුරු මැද නාවික පෙදෙස | 16.02.2015 | 30.12.2026 | 55,460,000.00 | 42,580,000.00 | 56.45% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 29 | උතුරු මැද නාවික විධානයේ කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම - (නාවික නිවාස සහ නාන කාමර වැඩිදියුණු කිරීම) | උතුරු මැද නාවික පෙදෙස | 25.10.2020 | 31.12.2025 | 31,200,000.00 | 22,310,000.00 | 80.50% |
| 30 | ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ආයතනයේ කාන්තා නිලධාරීන්ගේ සහ කනිෂ්ඨ නිලධාරීන්ගේ නිවස්නයන්හි නාන කාමරය ප්‍රතිසංස්කරණය කිරීම | උතුරු මැද නාවික පෙදෙස | 25.04.2023 | 31.12.2025 | 14,870,000.00 | 7,700,000.00 | 100.00% |
| 31 | උතුරු මැද නාවික විධානයේ මුළුතැන් ගෙවල් සහ ආහාර ගබඩා 06ක් ඉදිකිරීම | උතුරු මැද නාවික පෙදෙස | 25.02.2022 | 20.11.2025 | 22,930,000.00 | 11,440,000.00 | 66.00% |
| 32 | ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ආයතනයේ විදුලි ජනක මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ කපිතාන් සැපයුම් හා සේවා දෙපාර්තමේන්තුව (උමැ) සඳහා ගබඩා සංකීර්ණය සඳහා තනි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | උතුරු මැද නාවික පෙදෙස | 01.02.2022 | 19.07.2024 | 13,300,000.00 | 12,730,000.00 | 100.00% |
| 33 | ශ්‍රීලංනානෞ දීඝායු ආයතනයේ මීටර් 30ක් උස ස්වයං ආධාරක රේඩාර් කුලුනක් ඉදිකිරීම | ගිණිකොන නාවික පෙදෙස | 28.08.2024 | 31.03.2025 | 16,263,350.00 | 5,130,000.00 | 25.00% |
| 34 | ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම | ගිණිකොන නාවික පෙදෙස | 01.02.2024 | 31.12.2025 | 41,283,319.13 | 9,920,000.00 | 20.00% |
| 35 | ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම | වයඹ නාවික පෙදෙස | 06.07.2019 | 30.12.2025 | 250,000,000.00 | 194,710,000.00 | 56.60% |

ත්‍රිකුණාමලය නාවික තටාකංගණයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය





ත්‍රිකුණාමලය නාවික තටාකංගණයෙහි දසමහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම






නාවික හා සාගරික විද්‍යාපීඨයේ නිලධාරි පුහුණු කිරීමේ සංචිතය ඉදිකිරීම





විශේෂ යාත්‍රා බලසෙණ මූලස්ථානයේ සිව් මහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම






<u>විශේෂ යාත්‍රා බලසෙණ මූලස්ථානයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම</u>





<u>නාවික තටාකංගණයේ පෞරාණික ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම</u>








<u>ශ්‍රීලංනානෞ පැරකුම්බා ආයතනයේ අඩි 75ක සංඥා කුලුනක් ඉදිකිරීම</u>







**<u>නාවික තටාකංගණයේ මැහුම් මධ්‍යස්ථානය නාවිකයන්ගේ විවාහක නිල නිවාසයක් බවට පරිවර්තනය කිරීම (ෆ්ලික් නිල නිවාස 01,02,03,04)</u>**





<u>පෙපර් පොට් ජැටිය ප්‍රතිසංස්කරණය කිරීම</u>





<u>ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පස් මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම</u>





<u>වැලිසර මහල් දහයකින් යුත් කනිෂ්ඨ නාවිකයින්ගේ විවාහ නිවාස ඉදිකිරීම (පළමු අදියර)</u>






සමුද්‍ර ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) ව්‍යාපෘතිය පිහිටුවීම





දියතලාව කනිෂ්ඨ නිලධාරි නිවාඩු නිකේතනය ප්‍රතිසංස්කරණය







වැලිසර නාවික රෝහලහි ප්‍රධාන ප්‍රතිසංස්කරණ (පළමු අදියර)





ශ්‍රීලංනානෞ මහසෙන් ආයතනයේ මධ්‍යම නිලඇඳුම් ගබඩා ගොඩනැගිල්ල සඳහා ගිනි නිවීමේ පද්ධතියක් සැකසීමේ ව්‍යාපෘතිය





ශ්‍රීලංනානෞ ලංකා රාජකීය නාවික ස්වේච්ඡා සංචිත සංගමය සඳහා යෝජිත කාර්යාල ගොඩනැගිල්ල





වැලිසර නාවික හමුදා සංකීර්ණයේ සේවා වනිතා උපයෝගිතා මධ්‍යස්ථානයක් පිහිටුවීම






**<u>ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයේ සයමහල් කනිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම</u>**





**<u>ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ආයතනයේ පස් මහල් කනිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම</u>**





**<u>ශ්‍රීලංනානෞ නිපුණ ආයතනයේ පොදු භෝජනාගාරය සහ කනිෂ්ඨ නාවිකයින් සඳහා නවාතැන් සඳහා සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම</u>**





**ශ්‍රීලංනානෞ දක්ෂිණ ආයතනයේ ඉංජිනේරු වැඩපලෙහි වහලය ප්‍රතිසංස්කරණය කිරීම**





**ශ්‍රීලංනානෞ නිපුණ හි අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවතින මලාපවහන බැහැර කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම**







**සමුද්‍ර ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (MRCC) ව්‍යාපෘතිය පිහිටුවීම -හම්බන්තොට**





ශ්‍රීලංනානෞ දක්ෂිණ ආයතනයේ අංක 02 ලිස්සීමේ මාර්ගය ඉදිකිරීම
(නෞකාවන් අලුත්වැඩියාව සඳහා දිය යට දුම්රිය මාර්ගය පිළිසකර කිරීම)





ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ එළාර අංක 03 ජැටිය වැඩිදියුණු කිරීම





ශ්‍රීලංනානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය



පරිපාලන ගොඩනැගිල්ල



කනිෂ්ඨ නාවික නිවාස සංකීර්ණය



ජල කුලුන



නිලධාරි නිවාස සංකීර්ණය

උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම




නාවික අනුකණ්ඩ වංකලෙයිපාඩු වෙරළ නිරීක්ෂණ මධ්‍යස්ථානය III (ශ්‍රීලංනානෞ ගජබා)



නාවික අනුකණ්ඩ වංකලෙයිපාඩු වෙරළ නිරීක්ෂණ මධ්‍යස්ථානය I (ශ්‍රීලංනානෞ ගජබා)

**<u>උතුරු මැද නාවික විධානයේ කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම - (නාවික නිවාස සහ නාන කාමර වැඩිදියුණු කිරීම)</u>**





**<u>ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය හි කාන්තා නිලධාරීන්ගේ සහ කනිෂ්ඨ නිලධාරීන්ගේ නිවස්නයන්හි නාන කාමරය ප්‍රතිසංස්කරණය කිරීම</u>**





**<u>උතුරු මැද නාවික විධානයේ මුළුතැන් ගෙවල් සහ ආහාර ගබඩා 06ක් ඉදිකිරීම</u>**



නාවික අනුකණ්ඩ වලෙයිපාඩු (ශ්‍රීලංනානෞ බුවනෙක)



නාවික අනුකණ්ඩ පේසාලෙයි (ශ්‍රීලංනානෞ ගජබා)



නාවික අනුකණ්ඩ නරිවිලිකුලම් (ශ්‍රීලංනානෞ වුස්සදේව)

**<u>ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය ආයතනයේ විදුලි ජනක මධ්‍යස්ථානය සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම සහ කපිතාන් සැපයුම් හා සේවා දෙපාර්තමේන්තුව(උමැ) සඳහා ගබඩා සංකීර්ණය සඳහා තනි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම</u>**





**<u>ශ්‍රීලංනානෞ දීඝායු ආයතනයේ මීටර් 30 ක් උස ස්වයං ආධාරක රේඩාර් කුලුනක් ඉදිකිරීම.</u>**





<u>ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම</u>





ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම

 

## 2.2 නාවික හමුදාවේ ඉදිරි දැක්ම

### 2.2.1 ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

අ. නාවික හමුදාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍ර උපාය මාර්ගය 2025 යන ලේඛනය මගින් 2017 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කොට තිබූ අතර, එම සැලැස්ම තවදුරටත් 2030 වර්ෂය දක්වා නාවික හමුදාවේ ප්‍රධාන නෞකා සහ යාත්‍රා අවශ්‍යතාවයන් මත පහත සඳහන් වගුවේ ආකාරයට ක්‍රමානුකූලව සංවර්ධනය කර ගැනීම සඳහා සැලසුම් කර ඇත.

ආ. 2023 වසර සඳහා වැලිසර නාවික යාත්‍රා තැනීමේ අංගනයෙහි නිපදවීමට තිබූ IPC යාත්‍රා ගණන 3ක් දක්වා අඩු කළ අතර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය, යන්ත්‍ර නිසි කලට නොලැබීම හේතුවෙන් එම ඉදිකිරීම් ද මේ වන තෙක් ආරම්භ කර නොමැත.

ඇ. 2023 වර්ෂය සඳහා ඩෝනියර් ගුවන් යාත්‍රා අත්පත් කර ගැනීම සඳහා සැලසුම් කර තිබූ අතර, එය අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත අනාගතයේ දී සලකා බලනු ලැබේ.

ඈ. නියමිත UAVs දෙකක් අත්පත් කර ගැනීම තවමත් සිදු කර නොමැත.

| යාත්‍රාව/ යාත්‍රා වර්ගය | දැනට නාවික හමුදාව තුළ පවතින යාත්‍රා | 2024-2025 | 2026-2030 | 2031-2035 | 2036-2040 |
|---|---|---|---|---|---|
| ෆ්‍රිගේට් | 0 | - | - | 1 | 1 |
| අක්වෙරළ නිරීක්ෂණ නෞකා (OPV) | 8 | 1 | 1 | 2 | 4 |
| වේග මිසයිල ප්‍රහාරක නෞකා (FMV) | 2 | - | - | 4 | 2 |
| වේග මුර යාත්‍රා (FGB) වෙරළ ආරක්ෂක මුර නෞකා CPV | 11 | 1 | 2 | 4 | 4 |
| වේග නිරීක්ෂණ මුර යාත්‍රා (FPC) | 2 | - | - | 1 | - |
| බහුකාර්ය යාත්‍රාව(Multy-Purpose Vessel) | - | 1 | - | - | - |
| ටග් (Oceangoing Tug) | - | - | 1 | - | - |
| වේග ප්‍රහාරක යාත්‍රා (FAC) | 47 | - | 4 | 4 | 4 |
| සහයක යාත්‍රා P AUX | 1 | - | 1 | | 1 |
| ජල සමීක්ෂණ යාත්‍රා (Hydrographic Survey Vessel) | - | - | 1 | - | - |
| ගොඩබෑමේ යාත්‍රා (LST) | 1 | - | - | 1 | 1 |
| ගොඩබෑමේ යාත්‍රා (LCM) | 2 | - | - | 1 | 1 |
| ගොඩබෑමේ යාත්‍රා (LCU) | 2 | - | 1 | 1 | |
| ගොඩබෑමේ යාත්‍රා වායු කුෂන් LCAC (S) | - | - | - | 1 | 1 |
| වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා (IPC)සහ වෙරළාසන්න මුර යාත්‍රා (Wave Rider) | 101 | 6 | 6 | 6 | 10 |

### 2.2.2 ශ්‍රී ලංකා නාවික හමුදාවේ දැක්ම - 2025

| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | නාවික හමුදාවේ සීමිත වාහන සංඛ්‍යාවක් පවතින අතර, එක් වාහනයක් අපහරණය කිරීමේ දී එම වාහනය වෙනුවට අනුප්‍රාප්තික වාහනයක් ලබා දිම අත්‍යවශ්‍ය කරුණකි. එලෙස ලබා නොදීම තුළින් නාවික හමුදා කඳවුරු වෙත පවරා ඇති රාජකාරින් ඉටු කිරීමේ දී දැඩි අපහසුතාවයන්ට ලක් වේ. තවද, රටෙහි පවතින ආනයනික සීමා හා ආර්ථික තත්වය හේතුවෙන් නව වාහන මිල දී ගැනීම ද ප්‍රායෝගික තත්වයක නොපවතී ඒ අනුව නාවික හමුදාව අත්‍යවශ්‍යම වාහන පමණක් අපහරණය කරනු ලබයි. කරුණු එසේ වෙතත් වාහන අලුත්වැඩියාව සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන සීමා කිරිම, වාහන අලුත්වැඩියා කාලය ප්‍රමාද වීමට බලපාන ප්‍රධානම කරුණු බව නිරීක්ෂණය වේ. | අපහරණය කරනු ලබන වාහන සඳහා අනුප්‍රාප්තික වාහන දීම වෙනුවෙන් නව වාහන මිල දී ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කෙරේ. ඉහත පරිදි නව වාහන මිලදී ගැනීමට අපහසු වන්නේ නම් නාවික හමුදා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපදන වෙන් කිරීමට යේජනා කෙරේ. |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල් බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | - | - |
| 12 | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම | අනුකූල නොවේ | වසර 15ට වඩා පැරණි හඳුනාගත නොහැකි ණය ශේෂ පැවතීම | වසර 15ට වඩා පැරණි හඳුනාගත නොහැකි ණය ශේෂය හැර වර්තාමානයේ හිඟ හිටි ණය ශේෂය නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කිරීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා සෘජුවම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් නොකරන අතර, එම වාර්තා මාසිකව සහ ත්‍රෛයිමාසිකව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබයි | - |

| | | | | |
|---|---|---|---|---|
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවි හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | වාර්ෂිකව නාවික හමුදාවේ ඒ ඒ අංශයන් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට අදාළව සැලසුම් සකස් කිරීම | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | නාවික හමුදාවේ පවතින රාජකාරි ස්වභාවය හා ක්‍රියා පටිපාටියට අනුව රාජකාරීන් හා වගකීම් පවරනු ලබන අතර, අවස්ථානුකූලව ඊට අදාළ ගිවිසුම්ගත වීම් සිදු කරනු ලබයි | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. DEF/B/SLN/2024/02/24

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 27 දින

නාවික හමුදාධිපති

ශ්‍රී ලංකා නාවික හමුදාව

**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව සහ සහතික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

එච්.පී.ඩී.ගුණසේකර

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති (වැ.බ.) වෙනුවට

එච්.පී.ඩී. ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

2.ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. DEF/B/SLN/2024/02/24  ඔබේ අංකය / உமது இல. / Your No.  දිනය / திகதி / Date 2025 මැයි 27 දින

නාවික හමුදාධිපති

ශ්‍රී ලංකා නාවික හමුදාව

**ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබද ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වලින්, මූල්‍ය තත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ,ශ්‍රී ලංකා නාවික හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150,151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන

බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

(අ) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා නාවික හමුදාවේ 1202 ඉන්ධන සැපයීමේ වියදම රු. 9,703,308,156 ක් වූ අතර ඉන් රු. 373,986,555 ක් ප්‍රතිපූර්ණයකින් තොරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබාදෙන ඉන්ධන වියදම වන අතර අඛණ්ඩව මේ පිළිබඳ අනාවරණය කළද සමාලෝචිත වර්ෂයේදී ද වෙනත් වැය ශීර්ෂයක වියදමක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ 223 වැය ශීර්ෂය යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බැදීමට එළඹි සියළුම බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) යටතේ දැක්විය යුතු වුවද, 2025 වර්ෂයේ ගෙවීම් වවුචර් නියැදි පරීක්ෂාවේදී 2024 වර්ෂයට අදාල එකතුව රු. 711,192,718 ක් වටිනා වවුචර් 157 ක් සඳහා ගෙවීම් කර තිබුණද එය බැරකම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි.

(ඇ) අධ්‍යක්ෂ (මුදල්) ගේ 2025 පෙබරවාරි 10 දිනැති අංක එන්එච්කිව් / බීඑෆ්/ ඩීඑෆ් /41/2024 දරන ලිපිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ ශේෂ වටිනාකම රු. 659,650,414 ක් බව දක්වා තිබුණද 2024 දෙසැම්බර් 31 දිනට බැරකම් ප්‍රකාශය තුළ අදාළ වටිනාකම ඇතුළත්ව නොතිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2023 දෙසැම්බර් 29 දිනැති අයවැය චක්‍රලේඛ අංක 5/2023 හි 02 වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කරගැනීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීයාගේ හා ගණන් දීමේ නිලධාරීයාගේ වගකීම වුවද 2024 වර්ෂයට අදාලව 2025 වර්ෂය තුළ සිදුකරන ලද ගෙවීම් සම්බන්ධ නියැදි පරීක්ෂාවට අනුව ශ්‍රී ලංකා නාවික හමුදාවේ පුනරාවර්තන වැය විෂයයන් සඳහා රු.2,639,162,863 කින් හා ප්‍රාග්ධන වැය විෂයයන් සඳහා රු. 387,477,247 කින් ශුද්ධ ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් සඳහා එළඹ තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) SA -21 දරණ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව වෙනත් මුලාශ්‍ර මගින් අග්‍රිම ලැබීම් වටිනාකම රු. 4,118,432,741 ක් වුවද, ACA 03 ආකෘතියේ භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකම රු. 4,421,682,741 ක් වී තිබුණි. ඒ අනුව රු. 303,250,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) SA -21 දරණ භාණ්ඩාගාර මුද්‍රිත පිටපත අනුව වියදම් මගින් අග්‍රිම පියවීම් වටිනාකම රු. 76,065,969,500 ක් වුවද, ACA 03 ආකෘතියේ වියදම් මගින් අග්‍රිම පියවීම් වටිනාකම රු. 76,369,219,500 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 303,250,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාල මූල්‍ය නොවන වත්කම් (ඒසීඒ - 06) උපලේඛණය අනුව, 2024 දෙසැම්බර් 31 දිනට නාවික හමුදාව සතු නෞකා, යාත්‍රා, බෝට්ටු වටිනාකම ලෙස රු. 29,555,782,322 ක් දක්වා තිබුණද විගණනයට ලබාදී තිබූ උපලේඛනය අනුව එම වටිනාකම රු.32,958,956,068 ක් වූයෙන් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් හා දේපළ පිරියත හා උපකරණ සංචිතය රු. 3,403,173,746 ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

### 1.6.3 අත්තිකාරම් ගෙවීම්

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ දක්වා ඇති ණය ශේෂය රු.601,398,953 වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය ශේෂය රු.579,773,327 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු.21,625,626 ක වෙනසක් පැවතුණි. 2001 වර්ෂයේ සිට පැවත එන මේ සම්බන්ධයෙන් සොයා බැලීම ආරක්ෂක අමාත්‍යාංශය මගින් කමිටුවක් පත් කර තිබුණු අතර එම කමිටු වාර්තාව අනුව මෙම වෙනස පරීක්ෂා කිරීමට පොත් පත් හා ගිණුම් සාරාංශ නාවික හමුදාව සතුව නොමැති බැවින් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණය හා අත්තිකාරම් පාලන ගිණුමේ වෙනස එලෙසම පැවතුණි.

### 1.6.4 ගබඩා අත්තිකාරම් ගිණුම

(අ) විෂය අංක 223-02 ට අදාළ සිහිවටන ආදායම් ප්‍රකාශය සකස් කිරීමේදී මෙම ඒකකයෙන් නාවික හමුදාවේ ආදායම් ශීර්ෂයට ඇතුළත් කරන රාජ්‍ය ආදායම රු. 650,000,000 අඩුකර නොපෙන්වීම මත සිහිවටන ආදායම් ප්‍රකාශනයට අනුව

වසරේ ශුද්ධ ආදායම රු. 650,000,000 වැඩියෙන් පෙන්වීම හේතුවෙන් රු 74,166,769ක සෘන අගයක් ගත යුතු ශුද්ධ ආදායම වෙනුවට රු. 575,833,231 ක ධන අගයක් ශුද්ධ ආදායම දක්වා තිබුණි.

(ආ) විෂය අංක 223-02 මගින් 2024 වර්ෂයට අදාළව නාවික හමුදාවේ ආදායම් ශීර්ෂයට ඇතුළත් කරන රාජ්‍ය ආදායම වූ රු. 650,000,000 ක මුදලට අදාළ හරස් සටහන ඉදිරියට ගෙනා ලාභ අලාභ ගිණුමට හා අත්තිකාරම් ගිණුමට නොගැලපීම හේතුවෙන් ඉදිරියට ගෙනා ලාභ අලාභ ගිණුමේ ශේෂය හා අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 650,000,000 ක් අධි තක්සේරු වී තිබුණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට පිලියෙළ කල ශේෂ පත්‍රයේ වගකීම් තුළ අන්තර්ගත ඉදිරියට ගෙනා ලාභ අලාභ ගිණුමේ ශේෂය විය යුතු රු. 17,939,015 වෙනුවට එම ශේෂය රු. 667,939,015 ලෙස නිරූපණය වූ අතර වගකීම් තුළ අන්තර්ගත විය යුතු රු.457,629,434 වූ අත්තිකාරම් ගිණුමේ ශේෂය රු. 192,370,565 ක ශේෂයක් ලෙසට වත්කම් වලට අන්තර්ගත වී තිබුණි. මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ සමස්ථ වත්කම් හා වගකීම් රු. 192,370,565 කින් අධි තක්සේරු වී නිරූපණය විය.

(ඇ) 223-02 වැය අංකය මඟින් 2024 වර්ෂයට අදාලව නාවික හමුදාවේ ආදායම් ශීර්ෂය වෙත රු. 650,000,000 මුදලක් හරස් සටහන් ඔස්සේ මාරු කර ඇති නමුත් නාවික හමුදාව විසින් ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත ACA – 05 ආකෘතියෙහි වර්ෂය තුල සිදුකල හර කිරීම් තුල එහි වටිනාකමට හරස් සටහන් යටතට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මුදලින් කළ හර වටිනාකම රු. 650,000,000 වැඩියෙන් නිරූපණය කර තිබුණි.

(ඈ) විකුණුම් මත එකතු කල අගය මත බදු පිළිබඳ නියැදි පරික්ෂාවේදී 2024 අප්‍රේල් 08 වන දින විකුණුම් ඉන්වොයිස් අනුව එදිනට අදාළ වැට් වටිනාකම රු. 852,086 ක් විය යුතු වුවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වටිනාකම ගණනයේදී මෙම දිනට අදාළ විකුණුම් මත එකතු කල අගය මත බදු වටිනාකම ලෙස රු.803,961 ක් ලෙස රු.48,125 ක අගයක් අඩුවෙන් සැලකිල්ලට ගෙන තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන තුල භාණ්ඩාගාර දත්ත ඉදිරිපත් කිරීම් වල 2024 වර්ෂය සඳහා අනුමත සීමාවන් හි වාර්ෂික උපරිම හර ශේෂ සීමාවට අදාලව වර්ෂය අවසානයේ ශේෂය ලෙස ගබඩා අත්තිකාරම් (පුපුරණ ද්‍රව්‍ය) ගිණුමේ නිවැරදි අවසාන ශේෂය වන රු.457,629,434 ක වටිනාකම ඇතුලත් කල යුතු වුවද එහි වර්ෂය අවසානයේ ශේෂය ලෙස ඇතුලත් කර ඇත්තේ රු.737,575,826 ක වටිනාකමක් බව නිරීක්ෂණය විය.

(ඊ) Siam City Cement (Lanka) Ltd මගින් ආනයනය කරන ලද ඇමෝනියම් නයිට්‍රේට් තොගයෙහි මිල වෙනස හේතුකොටගෙන අඩුවෙන් විකුණුම් මිල ඉන්වොයිස් කිරීම හේතුවෙන් අලෙවි නියෝජිතයින් 17 දෙදෙනෙකුගෙන් එකතුව රු 2,886,505 ක් අය කර ගැනීමට කටයුතු කර ඇති අතර එම අගයන් මුදල් පොතට හර කිරීමත් විකුණුම් ගිණුමට බැර කිරීමත් සිදු කර ඇති නමුත් ඒ තුල ඇතුලත් විකුණුම් මත වන එකතු කල අගය මත බදු වටිනාකම විකුණුම් ගිණුමෙන් එකතු කල අගය මත බදු ගිණුමට ගෙන ගොස් නැති අතර ඒ අනුව ඉහත සඳහන් කල වටිනාකම තුල ඇතුලත් එකතු කල අගය මත බදු වටිනාකම වන රු. 440,200 කින් 2024 වර්ෂයේ විකුණුම් අධිතක්සේරු වීමත් එම වටිනාකම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම අඩුවෙන් දැක්වීමත් සිදුව තිබුණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු නොතිබුණු 1701 - පාඩු හා කපා හැරීම් වැය විෂයය සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 8,838,541 ක් මුදල් රෙගුලාසි 66 මඟින් මාරු කරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ 2103/18 වැය විෂයය යටතේ අභ්‍යන්තර දුරකතන හුවමාරු ඒකක හා ස්විච් ජාලය යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භ කර තිබූ අතර වර්ෂය අවසානයේ එහි භෞතික ප්‍රගතිය සියයට 53 ක් වී තිබුණි. ව්‍යාපෘති කටයුතු අවසන් නොකොට අදාළ 2103/18 වැය විෂයයෙන් රු.22,772,217 ක් එනම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් සියයට 45.5 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ත්‍රිකුණාමලයෙහි නාවික තටාංගනයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.1,657,000,000 ක් ඇස්තමේන්තුගත කර තිබුණද අවස්ථා 06 කදී රු. 764,865,000 ක් වෙනත් වැය ශීර්ෂ වෙත මාරු කර තිබුණි. වෙනත් වැය ශීර්ෂ වෙත මාරු කිරීමේ ප්‍රතිශතය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් සියයට 46 ක් විය. උක්ත ව්‍යාපෘතිය 2015 මාර්තු මස ආරම්භ කර තිබූ අතර වර්ෂ 10 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ව්‍යාපෘතිය අවසන්ව නොතිබියදී ව්‍යාපෘතිය සඳහා වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන වෙනත් වැය ශීර්ෂ වෙත මාරු කර තිබුණි.

## 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 71 වගන්තිය | කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවන ප්‍රතිපාදන හෝ අරමුදලේ ප්‍රභවය කුමක් වුවත් තනතුරු ඇති කිරීම, තනතුරු ශ්‍රේණිගත කිරීම, අනුමත සේවක සංඛ්‍යාව වැඩි කිරීම, තනතුරුවල පදවි නාමය වෙනස් කිරීම, නව අනුප්‍රමාණ හෝ වැටුප් පරිමාණ වේතන, දීමනා සහ අනෙකුත් පඩිනඩි හා පාරිශ්‍රමක ඇති කිරීම වැනි කරුණු සඳහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ පූර්ව අධිකාරී බලය අවශ්‍යවන අතර ඔහු විසින් ඒ සඳහා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකගත්වය ලබාගත යුතු වුවද නාවික හමුදාවේ කටයුතු සඳහා 2,224 ක් වූ සිවිල් කාර්ය මණ්ඩලයක් අනුමත කර ගැනිම සඳහා ලබාගත් එකඟතාවයන් අස්ථානගතවී ඇති බවට ප්‍රකාශකර ඇති බැවින් විගණනයට ඉදිරිපත් නොවුණි. |
| | (ii) මුදල් රෙගුලාසි | ගබඩා අත්තිකාරම් ගිණුමට අදාල කටයුත්ත සතු ස්ථාවර වත්කම් |

| | | |
|---|---|---|
| | 507 වගන්තිය | වල පැවැත්ම හා එකී වත්කම් විෂයයෙහි තත්ත්වය පිලිබඳ ප්‍රකාශයක් පිළියෙල කොට වාර්ෂික ගිණුම් සමග විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය. නමුත් එවැනි ප්‍රකාශයක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2020 අගෝස්තු 08 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 සහ 2024 නොවැම්බර් 06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 | නව අරමුදල් ඇති කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මූල්‍ය විනය පවත්වාගෙන යාම සඳහා විසර්ජන පනතින් අනුමත කෙරෙන අයවැයට පරිභාහිරව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම අනුමත නොකෙරන බැවින් විශේෂතම අවස්ථාවකදී පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකින් හැර වෙනත් කිසිදු ආකාරයකින් නව අරමුදල් ඇති කිරීම සපුරා තහනම් බව දක්වා තිබුණි.<br><br>ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් නම් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසිකොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු බවද ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනතක් මඟින් නීතිගත කිරීමට කටයුතු කල යුතු බවද වැඩිදුරටත් දක්වා තිබුණි. නාවික හමුදාව විසින් නාවික හමුදා මාලිමා සත්කාරක සේවාව, නාවික හමුදා ඉන්ධන පිරවුම්හල, තල්මසුන් නැරඹීමේ ව්‍යාපෘතිය හා නාවික කෘෂි ව්‍යාපෘතිය නමින් අරමුදල් 04 ක් පවත්වාගෙන යන අතර එම අරමුදල් 04 ට අදාළව බැංකු ගිණුම් 41 ක් පවත්වාගෙන යනු ඇත.මෙම සියළු ව්‍යාපෘති ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ලෙස පවත්වාගෙන යන නමුත් චක්‍රලේකන ප්‍රකාරව වහාම ක්‍රියාත්මකවන පරිදි එම අරමුදල් අහෝසිකර ඒවායේ මුදල් ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට හෝ අරමුදල පවත්වාගෙන යාමට සාධාරණ හේතු තිබේ නම් එම අරමුදල් පාර්ලිමේන්තු පනත මඟින් නීතිගත කිරීම 2025 මැයි මස දක්වා සිදුව නොතිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වන | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ එම ආයතනයට පැවරෙන නිශ්චිත ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් , ක්‍රියාත්මක කාල රාමුව , |

| | | |
|---|---|---|
| | ඡේදය හා මාර්ගෝපදේශ අංක 12 | අපේක්ෂිත ප්‍රතිදානය හා ප්‍රතිඵලයද ඒ සඳහා වගකිව යුතු පාර්ශවයද ඇතුළත්කළ යුතු නමුත්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් අංශයට පැවරී ඇති සියලු වගකීම් ක්ෂේත්‍ර හා ඒ යටතේ වන ක්‍රියාකාරකම් නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණු අතර වාර්ෂික ප්‍රතිපාදන වර්ෂය තුළ වැයකරනු ලබන ආකාරයත් අපේක්ෂිත මූල්‍ය හා භෞතික ප්‍රගතියේ ප්‍රතිශතයත් පමණක් දක්වා තිබුණි. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය හා මාර්ගෝපදේශ අංක 13 ප්‍රකාරව සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2. (අ) හා (ආ) වගන්ති | ප්‍රසම්පාදනය ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ලේඛනයක් පිලියෙල කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. |
| (ඉ) | 2020 ඔක්තෝම්බර් 26 දිනැති කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 02/2020 හි 02(vii) වගන්තිය | ආයතනයන්හි කාලීන සේවා අවශ්‍යතාවයන් අනුව අනුමත සේවක සංඛ්‍යාව සඳහා සංශෝධනයන් අවශ්‍ය වන විට අදාළ ආයතනය විසින් නවීන තාක්ෂණය භාවිතයෙන් වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමට අවශ්‍ය අවම තනතුරු සංඛ්‍යාවක් අඳුනාගෙන විධිමත් සාධාරණීකරණයක්ද සමග කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතු වුවද 2024 වර්ෂය අවසාන වන විටත් සංශෝධනයක් සහිත නව කාර්ය මණ්ඩලයක් කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමත කර ගැනිමට ශ්‍රී ලංකා නාවික හමුදාව කටයුතු සිදුකර නොතිබුණි. |
| (ඊ) | 2022 දෙසැම්බර් 14 දිනැති 2310/29 දරණ කාර්ය පටිපාටික රීති | රජයේ නිලධරයෙක්, සේවයට වාර්තා කිරීමෙන් පසු එම නිලධරයා වෙත රාජකාරී ලැයිස්තුවද ලිඛිතව භාරදීමට අංශවල හෝ ශාඛාවල ප්‍රධානියා අප්‍රමාදව කටයුතු කළ යුතු වුවද නාවික |

| | |
|---|---|
| සම්බන්ධයෙන් වූ අති විශේෂ ගැසට් පත්‍රයෙහි 100 වගන්තිය ප්‍රකාරව | හමුදාවේ සිවිල් කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාථමික සේවා සණයේ කාර්ය මණ්ඩලය වෙත රාජකාරී ලැයිස්තු ලබා දී නොතිබූ බව නිරීක්ෂණය විය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නැගෙනහිර නාවික විධානය යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා නාවික තටාකාංගණය සහ විශේෂ යාත්‍රා බලසණ මූලස්ථානය යන ගොඩනැගිලි දෙකෙහි ඉදිකිරීම් කටයුතු 2024 දෙසැම්බර් 31 දින වන විට අතරමග නතර වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ගොඩනැගිලි දෙකෙහි ඉදිකිරීම් සඳහා පිළිවෙළින් රු.388,608,541 ක සහ රු.14,590,616 ක පිරිවැයක් දරා තිබුණි.

(ආ) ගබඩා අත්තිකාරම් ගිණුමට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුත්තේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 517,878,993 ක අතිරික්තයක් ලෙස පෙන්නුම් කල අතර එය ඉකුත් වර්ෂයේ අතිරික්තයට සාපේක්ෂව රු. 196,313,141 කින් එනම් සියයට 27 කින් අඩුවී තිබුණි. 2024 වර්ෂයට සාපේක්ෂව දළ ලාභ අනුපාතය සියයට 32 සිට සියයට 24 දක්වා පහත වැටීමත් තොග පිරිවැටුම් අනුපාතය දින 126 සිට 128 දක්වා ඉහල යාමත් මෙයට හේතු වී ඇති බව නිරීක්ෂණය වේ. තවද සෙමින් අලෙවි වන තොග ලෙස Cartridges 20 SSG, Cartridges 410/6, AMMO 7.62*17MM BALL, AMMO .22 Blank Rifle සහ .38 (Special) Revolver යන තොග අයිතමයන් නිරීක්ෂණය වේ. එමෙන්ම ශ්‍රී ලංකා රජය විසින් 2024 සැප්තැම්බර් මස 21 වන දින සිට ජීවිත ආරක්ෂාව සඳහා ලබා දී තිබූ ගිනි අවි සහ පතරොම් නිකුත් කිරීම තාවකාලිකව අත්හිටු වීමත්, දැනට රටේ ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘතීන් සඳහා වෝටර් ජෙල්, සාමාන්‍ය ඩෙටනේටර් සහ විදුලි ඩෙටනේටර් මිලදී ගැනීමද සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ යාමද, මෙම ඒකකය තුල ඇමෝනියම් නයිට්‍රේට් තොග අවසන්වීම හේතුවෙන් එම තොග විශාල වශයෙන් අලෙවිකර ලබා ගත් ආදායම් පහත වැටීමත් ඊට සමගාමීව එම තොග මගින් අයකරගත් බිම්කුලිය නොමැති වීමත් යන කරුණුද හේතු වී ඇත.

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාදෙන ලද ඉන්ධන අතුරෙන්

පෞද්ගලික ආයතනයකට ලබාදෙන ලද ඉන්ධන වෙනුවෙන් 2025 මැයි මස වන විටත් රු. 1,186,954 ක් ප්‍රතිපූර්ණය කරගෙන නොමැති බව හඳුනාගන්නා ලදී.

(ඈ) වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු වල ව්‍යාපෘති වෙනුවෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික නිලධාරීන් හා නාවිකයන් යෙදවීම පිලිබඳව ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව නාවික හමුදාව විසින් එකී නාවික නිලධාරීන් හා නාවිකයන් වෙනුවෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමෙන් තොරව රු. 369,951,372 ක පමණ පිරිවැයක් වැටුප් ලෙස වැයකර දරා තිබුණි.

## 4.2 කළමනාකරණ දුර්වලතා

(අ) නැගෙනහිර නාවික විධානය යටතේ ක්‍රියාත්මක වන මූලතිවු හි නන්දිකඩාල් කලපුව ආසන්නයේ පිහිටි ශ්‍රීලංනානෞ ගෝඨාභය කඳවුරට අයත් වර්ග අඩි 1350 කින් යුත් A2, A3, A5, B2, B3, B5, C2, C3, C4 යන මුරකුටි වසර දෙකකට ආසන්න කාලයක සිට රාජකාරීය සඳහා ප්‍රමාණවත් නාවිකයින් නොමැතිවීම මත කඳවුරේ මුර රාජකාරි සඳහා උපයෝජනය නොවන බවට කරුණු ඉදිරිපත්ව තිබුණි.

(ආ) නැගෙනහිර නාවික විධානයට අයත් ශ්‍රීලංනානෞ වලගම්බා ආයතනයට අයත් කණිෂ්ඨ නාවික නිවාසය ලෙස යොදාගත් නාවික අනුබණ්ඩය කල්ලරාව යන ස්ථානයේ පිහිටි වර්ග අඩි 900 ක් පමණ වූ පෙරසවි ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පවතින බවට කරුණු ඉදිරිපත් වී තිබුණි.

(ඇ) දකුණු නාවික විධානයට අයත් ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයට අයත් කාර්යාල හා ගබඩා කාමර ලෙස යොදාගත් ශ්‍රීලංනානෞ රුහුණ තංගල්ල පිහිටි මහල් දෙකකින් සමන්විත ගොඩනැගිල්ලේ ආධාරක කණු අබලන් තත්ත්වයක පැවතීම හේතුවෙන් වර්ග අඩි 3,605 පමණ වූ ඉහල මහල ඌන උපයෝජිතව පැවති අතර ගොඩනැගිල්ල භාවිතයේදී අවධානම්කාරී තත්වයක් පවතින බවට ද කරුණු ඉදිරිපත් වී තිබුණි.

(ඈ) නැගෙනහිර, බටහිර,උතුරු,උතුරු මැද, දකුණු,වයඹ හා ගිණිකොණ යන නාවික විධානයන්ට අයත් පිළිවෙලින් 15,13,83,06,06,06 හා 08 ක් වූ වශයෙන් මුළු ගොඩනැගිලි 135 ක වටිනාකම තක්සේරු කිරීමට ප්‍රමාද වීම මත මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් යටතේ ගොඩනැගිලි වටිනාකම ලෙස ඇතුළත් කර නොතිබුණි. මෙම ගොඩනැගිලි 135 අතුරින් ගොඩනැගිලි 107 කට අදාළව තක්සේරු වටිනාකම ලබා ගැනීම සඳහා 2015 වර්ෂයේදීත්, එක් ගොඩනැගිල්ලක් සඳහා තක්සේරු වටිනාකම ලබා ගැනීමට 2021 වර්ෂයේදීත් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර තිබුණද ඒ සඳහා මෙතෙක් ප්‍රතිචාර නොලැබීම පිළිබඳ පසු විපරම්

සිදුකර නොතිබුණි. ගොඩනැගිලි 27 ක් සඳහා තක්සේරු වටිනාකම ලබා ගැනිමට මෙතෙක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීමක් හෝ සිදුකර නොතිබුණි.

(ඉ) නැගෙනහිර නාවික විධානයේ සැපයුම් හා සේවා දෙපාර්තමේන්තුවට අයත් අමතර කොටස් බෙදා හැරීමේදී SPDC II E, SPDC II L, SPDC III, SPDC IV, DOVARA CES, Lubrion stores, ගබඩාවන් තුළ සිදු කල අහඹු තොග පරික්ෂාවේදී එකතුව රු.109,307,836 ක් වූ තොග අවසන් පාරිභෝගිකයා විසින් රැගෙන ගොස් නොමැතිව දීර්ඝ කාලයක සිට ගබඩාව තුළ පැවතුණි. ගබඩාවේ තොග නිකුත් නොකර පැවතීමේ කාල සීමාව වසර 03 ඉක්ම වූ අයිතම 100 ක් ද, වසර 02 ත් 03 ත් අතර පැවති අයිතම 35ක් හා වසර 01ත් 02ත් අතර පැවති අයිතම 250ක් ද වශයෙන් විය. මේ අනුව වාර්ෂික තොග අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු නොකිරීම මෙන්ම ගබඩා කළමනාකරණයේ දුර්වලතාද පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) 2023 නොවැම්බර් 19 දින ප්‍රසම්පාදනය කර ලබා ගන්නා ලද රු. 8,513,956 ක මුළු වටිනාකමක් වූ යකඩ තහඩු 258 ක් විගණන දිනය වූ 2025 මාර්තු 04 වන විටත් ලෝහ ගබඩාවේ ගබඩාකර පැවතුණි. මෙම තොග නාවික හා සාගරික විද්‍යා පීඨයට අයත් ආපදා කළමණාකරන පුහුණු පාසලේ ඉදිකිරීමට යෝජිත ආපදා වර්ධන සිමියුලේටර් ව්‍යාපෘතිය සඳහා ඇණවුම්කර තිබුණි. මේ අනුව අවශ්‍යතාවය නිසි පරිදි කළමනාකරණය නොකර භාණ්ඩ ඇණවුම් කිරීම මගින් රාජ්‍ය මුදල් ඌන උපයෝජනයට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ.

(උ) නාවික මහ රෝහලේ ස්ථාපිත රුධිර කාන්දු පෙරන ඒකකයේ ඇති Dialysis යන්ත්‍ර 03 හි වගකීම් කාලය 2023 ජූලි 01 දින සිට අවසන් වී ඇති අතර 2024 මාර්තු 01 වන දින සිට 2025 මාර්තු 31 වන දින දක්වා සේවා ගිවිසුම්ගත වීම සඳහා 2023 දෙසැම්බර් 20 දින වෙන් වෙන් වශයෙන් අළුත්වැඩියා කිරීමේ පත්‍ර යොමුකර ඇති අතර අදාල සේවා ගිවිසුම් ගතවීම 2025 පෙබරවාරි මස වන විටත් සිදුව නොතිබුණි.

(ඌ) මැදගොඩ බංගලාවේ නවීකරණ කටයුතු සඳහා රු. 6,326,857 ක මුදලක් වියදම් කර ඇති නමුත් මේ වන විට නවීකරණ කටයුතු අතහැර දමා ඇති අතර මෙම නවීකරණ කටයුතු සඳහා මිළදී ගත් රු. 1,769,913 ක වටිනාකමකින් යුත් අයිතම නිෂ්කාර්යව ශ්‍රීලංනාතෞ ශිල්ප ආයතනයේ ගබඩා කර තිබුණි. එමෙන්ම මෙම නවීකරණය සඳහා දරන ලද වියදම වූ රු. 6,326,857 වියදමින් රු. 1,274,890 ක පිරිවැයක් දරා ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් නල ළිඳක් ස්ථාපනය කලද ඒ තුළින් ජල අවශ්‍යතාවය සපුරා ගැනිමට අපොහොසත්ව තිබුණි.

(එ) 2024 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය පරිදි අනුව නාවික පුද්ගලයන් 47 දෙනෙකුගෙන් ණය වයස් විශ්ලේෂණය අනුව වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට එකතුව රු. 6,832,530 ක් අය නොවී හිග හිට තිබුණි.

(ඒ) මිය ගිය සේවකයන් 06 දෙනෙකුගෙන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවති රු.645,634 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඔ) විශ්‍රාම ගිය සේවකයින් 13 දෙනෙකුගෙන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට රු.1,319,358 ක් සහ විශ්‍රාමගිය එක් සේවකයෙක්ගෙන් අවුරුදු 05 කට වැඩි කාලයක සිට රු.72,985 ක් වශයෙන් සේවකයන් 14 දෙනෙකුගෙන් අය විය යුතු ණය ශේෂ රු.1,392,343 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඕ) වැඩ තහනම් කළ සේවකයින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය ශේෂ රු.257,799 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන්ගෙන් රු.234,999 ක ණය ශේෂයක් වර්ෂ 04 ත් 05 ත් අතර පැරණි ණය ශේෂයක් විය.

(ක) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව සේවය හැර ගිය සේවකයින් 41 දෙනෙකු ගෙන් අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට රු. 5,474,636 ක මුදලක් සහ සේවකයින් 05 දෙනෙකුගෙන් අවුරුදු 05 කට වැඩි කාලයක සිට රු. 399,255 ක මුදලක් වශයෙන් සේවකයන් 46 දෙනෙකු ගෙන් අයවිය යුතු සේවක ණය ශේෂ රු.5,873,892 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

**4.3 වත්කම් කළමණාකරණය**

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.7051 පමණ වූ ශ්‍රී ලංනානෞ තම්බපණ්නි ආයතනය මඟින් පාලනය වන පරණ පුත්තලම නාවික නිරීක්ෂණ මුරපොළ පිහිටි ඉඩම හා පරණ පුත්තලම නාවික අනුබණ්ඩය ආසන්නයේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අංක 196 දරණ නිල නිවාසය නාවික හමුදාවට පවරාදෙන ලෙස ඉල්ලීමක් කර ඇති නමුත් ඒ සඳහා එකගවිය නොහැකි බවට 2022 ඔක්තෝම්බර් 05 වන දිනැති අංක පො(ප)06/දු.නි/ප්‍ර.අවා/2018 දරණ දුම්රිය සාමාන්‍ය අධිකාරීගේ ලිපිය මඟින් දැනුම් දී ඇති බව 2022 නොවැම්බර් 08 වන දින ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOD/PAC/08/2128/L/NY දරණ ලිපිය මඟින් දැනුම් දී තිබුණද එම ස්ථානයේ නාවික නිරීක්ෂණ මුරපොළ පවත්වාගෙන යමින් තිබුණි.

(ආ) වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.1011 පමණ වූ ශ්‍රීලංනානෞ බුවනෙක ආයතනය යටතේ පවතින වලෙයිපාඩු දකුණ 02 පිහිටි ඉඩම 2020 අගෝස්තු 14 දිනැති අංක PA/12/MS/19/252 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමණාකරන ජෙනරාල්ගේ ලිපිය මඟින් අදාල කොන්දේසිවලට යටත්ව වෙරළ ආරක්ෂක මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ලබා දී තිබුණද පවරාගැනීමේ කටයුතු මන්දගාමීව සිදු වෙමින් පැවතුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දින වන විට නාවික හමුදාව විසින් සිය භුක්තිය සඳහා තාවකාලික එකගතාවයන් ලබා ගැනීමට කටයුතු කරමින් පැවති වෙනත් දෙපාර්තමේන්තු සහ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 404.2386 ක් පමණ විය. ඒ අතරින් හෙක්ටයාර 0.1517 ක් පමණ වූ මයිලඩි පිහිටි ඉඩම, හෙක්ටයාර් 0.4046 ක් පමණ වූ ඉපලෝගම පිහිටි ඉඩම, හෙක්ටයාර් 0.1517 ක් පමණ වූ හම්බන්තොට පිහිටි ඉඩම, හෙක්ටයාර 0.8093 ක් පමණ වූ ඔළුවිල් වරාය පිහිටි ඉඩම යන ඉඩම් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භුක්තිය සඳහා තාවකාලික එකහතාවන් ලැබී නොතිබුණි.

(ඈ) සමස්ත ප්‍රමාණය හෙක්ටයාර් 6.574 යුත් ඉඩම් 05 ක් නාවික හමුදාව වෙත පවරා දීමේ කටයුත්ත කඩිනමින් කරදෙන මෙන් 2024 ජූලි හා දෙසැම්බර් මාසවල ඉඩම් කොමසාරිස්වරයාගෙන් ඉල්ලීම් කර තිබුණද ඒ සඳහා මේ දක්වා ප්‍රතිචාර ලැබී නොතිබුණු අතර පසුවිපරම් සිදුව නොතිබුණි.

(ඉ) සමස්ථ ප්‍රමාණය හෙක්ටයාර් 7.1094 පමණ වූ වරාය අධිකාරියට අයත් ඉඩම් 10ක නාවික හමුදාවේ භුක්තිය සඳහා එකහතාවය ලබාදෙන ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2023 සැප්තැම්බර් 27 වන දින ඉල්ලීම්කර තිබුණද විගණිත දිනය දක්වා එහි එකහතාවය ලබා දී නොතිබුණි.

(ඊ) බටහිර නාවික විධානයට අයත් අයිතම 04 ක් හා නැගෙනහිර නාවික විධානයට අයත් අයිතම 03 ක් 2022 හා 2023 වර්ෂවලදී අළුත්වැඩියා කිරීම සඳහා පිටත ආයතන වෙත භාර දී 2024 දෙසැම්බර් 31 දින වන විට වසර 02ක කාලයක් ඉක්මවාගොස් තිබූ නමුත් අළුත්වැඩියා කටයුතු නිමකර ආපසු නාවික හමුදාව වෙත භාරදී නොතිබූ බව නිරීක්ෂණය විය. තවද එකී අයිතම් සම්බන්ධයෙන් ගිවිසුම් කාලයද අවසන් වී තිබුණි.

(උ) නාවික හමුදාවට අයත් ද්‍රව්‍ය, උපකරණ, ලී බඩු උපකරණ, යන්ත්‍ර, පරිගණක උපාංග, වානේ කබඩ් හා අල්මාරි වැනි ස්ථාවර වත්කම් අතුරින් මිළදී ගැනීමේ පිරිවැය රු. 7,688,721 ක් වූ අයිතම 2024 දෙසැම්බර් 31 දිනට අළුත්වැඩියා කල නොහැකි

ගර්භිත තත්ත්වයේ පැවතියද එම භාණ්ඩ නිරවුල් කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් නෞකා / යාත්‍රා 03 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ගර්භිත තත්ත්වයේ පසුවීම හේතුවෙන් අපහරණය කිරීමට තීරණය කර තිබුණද එම කටයුතු අවසන්ව නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා නාවික හමුදාවට අදාලව ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමින් නාවික හමුදා පුද්ගලයින් 55,000 ක් අනුමත කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට තත්‍ය සේවක සංඛ්‍යාව 42,454 වූ බැවින් ජ්‍යෙෂ්ඨ හා තෘතියික මට්ටමේ පුරප්පාඩු 12,546 ක් නිරීක්ෂණය විය. එය සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 22 ක පමණ ප්‍රතිශතයක් විය. ඒ තුළ පුරප්පාඩු වූ ජ්‍යෙෂ්ඨ නාවික හමුදා නිලධාරීන් සංඛ්‍යාව 655 ක් වූ අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 17 ක් පමණ විය. පුරප්පාඩු වූ තෘතියික මට්ටමේ නාවික හමුදා පුද්ගලයින් සංඛ්‍යාව 11,891 ක් වූ බැවින් එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 23 ක් පමණ වී තිබුණි.

(ආ) නාවික හමුදාවට අදාළව ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතීක හා ප්‍රාථමික මට්ටමින් නාවික හමුදා සිවිල් සේවක සංඛ්‍යාව 1,936 ක් අනුමත කර තිබුණද 2024 දෙසැම්බර් 31 දින වන විට මුළු තත්‍ය සේවක සංඛ්‍යාව 1,200 ක් වූ බැවින් 736 ක් හෙවත් සියයට 38 ක් පුරප්පාඩුව පැවතුණි. ජ්‍යෙෂ්ඨ, තෘතියික, ද්විතීක හා ප්‍රාථමික මට්ටම් වලට අදාළ සිවිල් සේවක පුරප්පාඩු ප්‍රතිශතය පිළිවෙලින් සියයට 30,92,50 හා 37 ක් වශයෙන් වූ අතර මෙම තත්ත්වය නාවික හමුදාවට ඉහළ කාර්යසාධනයක් ලබා ගැනීමට බාධාවක් වී තිබුණි.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනට වන විට ස්ථිර නොවූ සිවිල් කාර්යමණ්ඩලයේ සේවකයන් සංඛ්‍යාව 10 ක් දෙනෙකු පමණ වූ අතර ඔවුන් බඳවා ගැනීම 2018 හා 2019 වර්ෂ වලදී සිදුකර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට මෙම සේවකයන් වසර 05 කට වඩා වැඩි කාලයක සිට සේවය කණ්ඩනය කරමින් සේවයේ යොදවාගෙන තිබුණි. සිවිල් කාර්යය මණ්ඩලය තුළ සේවකයන් 736 ක පුරප්පාඩු වූ සංඛ්‍යාවක් පැවතුනද මෙකී සේවකයන් වසර 05ක් මුළුල්ලේ සේවය කණ්ඩනය කරමින් සේවයේ යොදවා ගැනීම ගැටළු සහගත විය.

එච්.පී.ඩී.ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට

එච්.පී.ඩී. ගුණසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය